
# 2022




# වාර්ෂික වාර්තාව
# ANNUAL REPORT

## ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාව
## EHELIYAGODA PRADESHIYA SABHA

036-2258012/ 0362258014
ප්‍රාදේශීය සභාව, ඇහැළියගොඩ
ehelips@gmail.com
Eheliyagoda Pradeshiya Sabha



සපිරි පුරවරය

# පටුන


01

## හැඳින්වීම

- ඇහැලියගොඩින් බිඳක්
- අපේ සභාව
- අපගේ සේවා
- දැක්ම
- මෙහෙවර

02

## මූල්‍ය තොරතුරු

- මූල්‍ය සාරාංශය
- ආදායම් විශ්ලේෂණය
- වියදම් විශ්ලේෂණය
- වත්කම්, වගකීම් හා හිමිකම්

03

## සභා කටයුතු

- සභාපති ලේකම් පණිවිඩය
- අපගේ මහ සභාව
- සංවිධාන සටහන
- තීරණ කමිටු

## 04

### ආයතනික කාර්ය සාධනය

- පොදු පරිපාලනය
- සෞඛ්‍ය සේවා
- භෞතික සැලසුම්, මං මාවත්, ඉඩම් හා ගොඩනැගිලි
- ජලසේවා
- මහජන උපයෝගීතා සේවා
- සුභසාධන සේවා

## 05

### යහපාලනය

- යහපාලන සංවිධාන ව්‍යුහය
- යහපාලන ක්‍රියාකාරකම්
- ආයතනික සමාජ වගකීම
- තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීම සඳහා අපගේ කැපවීම

## 06

### අපගේ ජයග්‍රහණ

## 07

### මූල්‍ය වාර්තා

- විගණකාධිපති වාර්තාව
- ආදායම් වියදම් ගිණුම
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
- ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- මූල්‍ය ප්‍රකාශ සටහන්





# 01. හැඳින්වීම



ඇහැලියගොඩින් බිඳක්

අපේ සභාව

අපගේ සේවා

දැක්ම

මෙහෙවර

# ඇහැලියගොඩින් බිඳක්

## භූ විෂමතාව



ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය කඳු හෙල් හා උස් බෑවුම්වලින් යුක්ත වේ. මෙම බල ප්‍රදේශයේ බටහිර දිගින් පිහිටි කරදන, කලටුවාව, වෑවිල යන ප්‍රදේශ කඳු සහිතය. උස මුහුදු මට්ටමේ සිට අඩි 800 - 1200 ක් අතර වේ.

## දේශගුණය



සාමාන්‍යයෙන් තෙත් කලාපීය දේශගුණයකින් යුත් මෙම ප්‍රදේශයට මැයි, අගෝස්තු කාලයේ නිරිත දිග මෝසම් සුළං මගින් හා නොවැම්බර්, පෙබරවාරි කාලය තුළ ඊසාන දිග මෝසම් සුළං මගින් වර්ෂාපතනය ලැබේ. එම වර්ෂාපතනය හේතුවෙන්ම වර්ෂය පුරා ඉතා සෞම්‍ය දේශගුණයකට ද හිමිකම් කියයි.

# පස් වර්ග



ශ්‍රී ලංකාවේ පස් වර්ගීකරණය අනුව මෙම බල ප්‍රදේශයේ රත් කහ පොඩ්සොලික් නම් පස් වර්ග බහුල වශයෙන් ඇති බව තහවුරු වී ඇත. මේ හැර රත් පස්, දුඹුරු පස්, බොරළු පස්, දියළු පස් ද මද වශයෙන් දැකිය හැකි ය.

# භූමි පරිහරණය හා ඉඩම් භුක්තිය







මෙහි වැඩි වශයෙන් කෘෂි කර්මාන්තය මෙන්ම රබර් වගාව ද දැකිය හැකි අතර තේ හා පොල් වගාව ද ඒ අතර වේ. වී ගොවිතැන වැඩි වශයෙන් කෙරෙන්නේ අඳ ගොවි ක්‍රමයට වන අතර තට්ටු මාරු ක්‍රමයට තමන්ගේ කුඹුරු වගා කරන්නෝද වෙති. එසේම ප්‍රදේශවාසීන්ගෙන් වැඩි කොටසක් පරම්පරා ඉඩම් භුක්තියට හිමිකම් කියන අතර රජය මගින් ලබා දුන් ඉඩම්වල ද පදිංචි වී සිටිති.



# ඓතිහාසික පසුබිම

ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විමසා බැලීමේ දී නොයෙකුත් ජනප්‍රවාද රාශියකින් යුක්ත වේ. එහි ඉතිහාසය සීතාවක රාජසිංහ සමයේ රජ කල 11 වන රාජසිංහ රජ සමය දක්වා දිවයයි. පළමු රාජසිංහ රජු නිතර වෙස් වලාගෙන සාමාන්‍ය මිනිසෙකු ලෙස රටපුරා ඇවිද රට වැසියන්ගේ දුක සැප සොයා බලා පිළියම් යෙදූ අභීත වීර පුරුෂයෙකු ලෙස ප්‍රචලිතය. මෙසේ එක් දිනක් රට වැසියන්ගේ දුක සැප විචාරමින් වීදි සංචාරය කරන විට රෑ බෝ වූ බැවින් රාත්‍රී කාලය ගත කිරීමට සුදුසු ස්ථානයක් සොයා ගෙන යන අවස්ථාවේ දී ඇහැල මලී නමින් හැදින්වූ රූමත් කාන්තාවකගේ නිවසේ රාත්‍රිය ගත කර ඇත. රජතුමාට ඉහලින් ගරු සත්කාර කල මේ කාන්තාව කෙරෙහි පැහැදුන රජතුමා මේ ප්‍රදේශය ඇහැලිගේ ගොඩැල්ල ඇහැලියගොඩ වූ බව පැරැන්නන්ගේ මතයයි.

ඇහැලියගොඩ යන නම නිර්මාණය වූ තවත් එක් මතයක් නම් අතීතයේ මේ ප්‍රදේශය ඇහැලමලී නමින් හැදින්වූ කාන්තාවක් ජීවනෝපාය ලෙසින් රෙදි සේදීම තම වෘත්තිය කොට ගෙන ජීවත් වූ කාලෙක දුර ගමන් විඩාව සංසිඳුවා ගැනීම සඳහා මෙම ස්ථානය නවාතැනක් ලෙස භාවිතා කොට ඇත. මෙම ස්ථානය පසුකලෙක ඇහැලිගේ ගොඩැල්ල ඇහැලියගොඩ වූ බව ජනප්‍රවාදයේ කියවේ.

# අපේ සභාව

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ පල්ලෙ පත්තු ගම් සභාව වශයෙන් පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව උතුරින් කොළඹ බටහිරින් කළුතර නැගෙනහිරින් කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් ද දකුණින් කුරුවිට ප්‍රාදේශීය සභා සීමාවෙන් ද වෙන්ව පවතී. ව.කී.මීටර් 139 ක් පුරා ව්‍යාප්තව පවතින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 44 කින් යුක්ත වේ. 1947 ට පෙර මෙම ප්‍රදේශය අයත් වූයේ කුඩා නගර සෞඛ්‍ය ආරක්ෂණ සභා පනත යටතේ සෞඛ්‍ය ආරක්ෂණ සභාවට ය.


එවකට පළාත් පාලන ඇමැතිව සිටි එස්.ඩබ්.ආර්. ඩී.බණ්ඩාරනායක මැතිතුමන් 1947 ජනවාරි 01 දින තම අත්සනින් යුතුව නිකුත් කරන ලද එල්.ටී.බී/43 පී33/1/42 දරණ චක්‍රලේඛය අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසක් හා රත්නපුර දිස්ත්‍රික්කයේ කොටසක් එක්ව පවත්වාගෙන ගිය කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව ගම් සභා පනතට ගෙන ඇත. ඒ අනුව එහි සෞඛ්‍ය ආරක්ෂණ සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් කොටස පනාවල හා අටුළුගම් කෝරළේ ගම් කාර්ය සභාවට ද, රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොටස කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් කාර්ය සභාව ලෙස ද නම් කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ධූර කාලයේ පරිපාලන හා සංවර්ධන කටයුතුවලට අදාළව තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ජනතාවට පළාත් මට්ටමින් ඵලදායි දෙස සහභාගිවීම හා වැඩි අවස්ථාවක් සලසාදීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා ද එම සභාවේ බලතල හා කාර්යයන් හා කර්තව්‍යයන් විනිශ්චය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ අනුසාංගික සියළු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 1987 අප්‍රේල් 16 දින ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව 1991.07.01 දින සිට අහැලියගොඩ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය විය.

මේ අනුව 1931 සිට 1948 දක්වා කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව මගින් ද, 1948 සිට 1977 දක්වා කුරුවිට කෝරළේ පල්ලෙ පත්තු ගම් සභාව මගින් ද, 1977 සිට 1991.06.31 දක්වා විශේෂ කොමසාරිස්වරයෙකු යටතේ ද, 1991.07.01 දින සිට 2022.03.19 දක්වා ප්‍රාදේශීය සභා සභාපතිවරුන් යටතේ ද පාලනය වෙමින් පැවතිණි.



# සභා බල ප්‍රදේශයේ සමාජ, ආර්ථික පසුබිම



භූමි ප්‍රමාණය - ව.කි.මී.139



නාගරික බල ප්‍රදේශය - ව.කි.මී.16.69



රාජ්‍ය ආයතන - 28



ඉඩම් - 935



නිවාස - 3885



ව්‍යාපාර ස්ථාන - 1412



ආගමික ස්ථාන - 25



# ආයතනය සතු සම්පත්

## වාහන

කැබ් රථ - 04
ත්‍රිවිලර් - 01
ජල බවුසර - 01
ගලි බවුසර - 01
ටැක්ටර් හා ට්‍රේලර් - 04
ටිපර් රථ - 01
බැකෝ යන්ත්‍ර - 01

## සේවා ආයතන

ආදාහනාගාර - 01
ආයුර්වේද බෙහෙත් ශාලා - 04
පුස්තකාල - 04
කියවීම් ශාලා - 04
පෙර පාසල් - 03

## සේවා ස්ථාන

කසල අංගන - 02
සුසාන භූමි - 11
පොදු ළිං - 58
ජල ව්‍යාපෘති - 02
ක්‍රීඩා පිටි උද්‍යාන - 02
රැස්වීම් ශාලා - 03
සතිපොළ - 03
පොදු වැසිකිළි - 02
ප්‍රජා මණ්ඩල - 10

## බදු ඒකක

වෙළඳ බලපත්‍ර ඒකක - 560
කර්මාන්ත බදු ඒකක - 35
ව්‍යාපාර බදු ඒකක - 396
වරිපනම් ඒකක - 6562
කඩ කාමර - 61
ධීවර සංස්ථාව සතු කඩ කාමර - 01

මස්කඩ - 03

# ආයතනය සතු මානව සම්පත



| | |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 86 |
| කොන්ත්‍රාත් පදනමින් | 02 |
| සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය | 79 |
| කොන්ත්‍රාත් පදනමින් | 24 |
| පුරප්පාඩු | 07 |



# අපගේ ප්‍රධාන සේවා


පොදු පරිපාලන සේවා
සෞඛ්‍ය සේවා
භෞතික සැලසුම් මං මාවත් ඉඩම් හා ගොඩනැගිලි
ජල සේවා
සමාජ උපයෝගිතා සේවා
සුභ සාධන සේවා

# පොදු පරිපාලන සේවා

ආයතනයේ සේවය කරන සියළුම නිලධාරීන්ගේ හා සේවකයින් තම කාර්යභාරය කාර්යක්ෂම හා අනලස්ව ඉටුකරමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවට අනගි සේවයක් ඉටු කිරීම සඳහා විනිවිද භාවයෙන් යුක්තව මූල්‍ය කළමනාකරණය කර ආදායම් ඒකරාශි කිරීමත්, ස්වයං උත්පාදන ආදායම් වැඩි කර ගැනීමත් මෙමගින් සිදු වේ.

### කාර්යයන්

- සාමාන්‍ය පරිපාලන කටයුතු
- මූල්‍ය කටයුතු
- ආදයම් තක්සේරුව හා ඒකරාශිකරණය
- අභ්‍යන්තර විගණනය
- පුහුණු කිරීම්



# සෞඛ්‍ය සේවා

කසලවලින් තොර දැකුම්කළු නගරයක් බවට අහැලියගොඩ නගරය පත්කිරීමටත්, සභාබල ප්‍රදේශයේ මහජනතාවගේ සෞඛ්‍ය නගා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.

### කාර්යයන්

- සාමාන්‍ය පරිපාලන කටයුතු
- රෝග වැලැක්වීමේ කටයුතු
- ආයුර්වේද වෛද්‍ය පහසුකම්
- ආහාර පර්යේෂණ කටයුතු
- කාණු පිරිසිදු කිරීම
- සෞඛ්‍ය අධ්‍යාපනය
- මාතෘ හා ළදරු සෞඛ්‍ය
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
- පරිසර සංරක්ෂණ කටයුතු
- රුක්රෝපණ වැඩසටහන්
- ඩෙංගු නිවාරණ වැඩසටහන්
- දුම්වැටි හා මත්ද්‍රව්‍ය වැඩසටහන්



# භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු

ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මංමාවත්, පාලම් හා බෝක්කු කාණු ඉදිකිරීම හා නඩත්තු කරමින් මහජනතාවට මාර්ග පහසුකම් සැලසීමටත්, සැලසුම් සහගත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමත්, මෙමගින් සිදු කෙරේ.



## කාර්යයන්

- සාමාන්‍ය පරිපාලනය
- මාර්ග, පාලම්, බෝක්කු, කාණු ඉදිකිරීම හා නඩත්තුව
- ඉඩම් ගොඩනැගිලි සංවර්ධනය කිරීම හා නඩත්තුව

# ජල සේවා

ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා අනෙකුත් ජල අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු ළිං, ජල කරාම, ජල ව්‍යාපෘති නඩත්තු කිරීම ඉදිකිරීම සැලසුම් කිරීම හා වියළි කාලයේ ජල බවුසර් මගින් ජලය බෙදාහැරීම මෙමගින් සිදු කෙරේ.



## කාර්යයන්

- සාමාන්‍ය පරිපාලනය
- පොදු ළිං, ජල කරාම, ජල ව්‍යාපෘති නඩත්තු කිරීම
- පොදු ළිං, ජල කරාම, ජල ව්‍යාපෘති ඉදිකිරීම
- වියළි කාලයේ ජල බවුසර් මගින් ජලය බෙදා හැරීම

# පොදු ආවශ්‍යක සේවා කටයුතු

ප්‍රදේශයේ මහජනතාවගේ පොදු අවශ්‍යතාවයන් සඳහා පොදු වෙළඳපොළවල් ඉදිකිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම හා මහජනතාවගේ සුබ විහරණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර පවත්වාගෙන යාමට අවශ්‍ය පොදු පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.



## කාර්යයන්

- සාමාන්‍ය පරිපාලනය
- පොදු වෙළඳපොලවල් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම
- වීදි ආලෝක කිරීම
- ආදාහනාගාරය පවත්වාගෙන යාම

# සුබ විහරණ කටයුතු හා සුභසාධන සේවා

පොදු මහජනතාවගේ සුබ විහරණය හා සුභසාධනය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම, දැනුම වැඩි දියුණු කර ගැනීමට හා ක්‍රියාශීලී පරපුරක් නිර්මාණය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.



## කාර්යයන්

- සාමාන්‍ය පරිපාලනය
- පුස්තකාල පහසුකම් සැපයීම
- ක්‍රීඩාපිටි හා උද්‍යාන පවත්වාගෙන යාම
- පෙරපාසැල් පවත්වාගෙන යාම
- මහජන ආධාර හා සහන සැලසීම

01. මාහර

02. මාහිංගොඩ

03. අස්ගඟුල උතුර

04. අස්ගඟුල දකුණ

05. ඇහැලියගොඩ වත්ත

06. කැන්දනගමුව ඉහළගම

07. කැන්දන්ගමුව නගරය

08. විලේගොඩ

09. තොරණගොඩ

10. මෝරගල

11. පැල්පිටිය

12. උඩුමත්ත

13. යකුදාගොඩ

14. වලව්ට

15. මීන්නාන

16. දියුරුම්පිටිය

17. ගැටහැත්ත

18. නැගෙනහිර විලේගොඩ

19. බෝපැත්ත දිද්ද

20. ඉද්දමල්ගොඩ

21. නාපාවල

22. ගනේගොඩ

23. උඩුවක

24. හුලද්දූව

25. බටහිර කලටුවාව

26. නැගෙනහිර කලටුවාව

27. හේවායින්න

28. කැන්දන්ගමුව පහලගම

29. වියලගොඩ

30. නාකන්දල

31. බුළුගහපිටිය

32. නැදුරන

33. පලීගල

34. මියනකොළතැන්න

35. කිරිපෝරුව

36. හිඳුරංගල

37. මීටිපොළ

38. ඇඹපොළ

39. උතුරු කරඳන


40. දකුණු කරඳන

41. නුගදණ්ඩ

42. මාපොට

43. බටහිර කරඳන

44. සිරිසමන්පුර




සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම සේවා වසම් සීමා



## දැක්ම

ජනතා සේවය තුළින් සපිරි
පුරවරයක් කරා

## මෙහෙවර

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ
මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා
සේවාවන්ට සහ මාර්ග පහසුකම් සැපයීම ද,
ජනතාවගේ සුබ විහරණය හා
සුභ සාධන පහසුකම් ආරක්ෂා කිරීම ද,
අදාළ සියළු කරුණු විධිමත් කිරීම,
පාලනය කිරීම හා පරිපාලනය කිරීම ද,
ආයතනයේ ප්‍රමුඛ මෙහෙවරක් වේ.



### කාර්යක්ෂමතාවය

මහජනතාව කෙරෙහි විශිෂ්ඨ, කඩිනම්, අප්‍රමාදී සේවාවක් සැපයීම.

### විනිවිදභාවය

විශ්වසනීය හා සත්‍යභාවය මහජනතාවට අවබෝධ කිරීමේ හැකියාව.

### වගවීම

මහජනතාව වෙනුවෙන් ලබාදෙන නිරවුල් කාර්යක්ෂම සේවාව පිළිබඳ තහවුරුවීම.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම හා එය විශිෂ්ඨ අන්දමින් පවත්වාගෙන යාම.

## ප්‍රධාන අරමුණ



මදරසිංහාරාමය පුරාණ විහාරය

# 02. මූල්‍ය තොරතුරු



# ආදායම් විශ්ලේෂණය

## වරිපනම් හා බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කල ගම් ප්‍රදේශ වශයෙන් නම් කර ඇති ඇහැලියගොඩ නගර සභා සීමාව තුළ වරිපනම් බදු අයකරනු ලබයි. එය 2012 වර්ෂයේ තක්සේරු වටිනාකම මත මුළු දේපළ වටිනාකමින් 10% ක ප්‍රතිශතයක් ලෙස මුදල් අයකරනු ලබයි. වරිපනම් බදු ඒකක 6562 ක් වන අතර රාජ්‍ය ආයතන, ආගමික ස්ථාන මෙයට ඇතුළත් වේ.

ප්‍රදේශයේ සංචාරක ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි ව්‍යාපාරවලින් 1%ක බද්දක් අයකරනු ලබයි. හෙක්ටයාර් 01 කට වඩා වැඩි ඉඩම්වලින් රු.50ක අක්කර බදු මුදලක් අයකරනු ලබයි.

විනෝද බදු ආඥා පනතට අනුව සභා බල ප්‍රදේශයේ විනෝද උත්සව වලින් 15%ක ප්‍රතිශතයක් මත විනෝද බදු අයකරනු ලබයි.


මේ අනුව වරිපනම් හා බදු යටතට වරිපනම් බදු, අක්කර බදු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, විනෝද බදු ඇතුළත් වේ. 2020 වර්ෂයේ ඇස්තමේන්තු මුදලට වඩා 2022 වර්ෂයේ ඇස්තමේන්තු මුදල අඩුවීමක් පෙන්නුම් කරයි. එයට හේතුව වී ඇත්තේ 2020 වර්ෂයේ ව්‍යාපාර බදු අයකල ස්ථාන 2021 හා 2022 වර්ෂය වනවිට බලපත්‍ර ගාස්තු විෂයට ඇතුළත් වී ඇති බැවින් ඇස්තමේන්තු මුදල අඩු වීමක් සිදු වී ඇත. 2020 හා 2021 වර්ෂවලට වඩා 2022 වර්ෂයේ ඇස්තමේන්තු ආදායමට වඩා ලැබීම් වැඩිවීමක් පෙන්නුම් කර ඇත්තේ 2022 වර්ෂයේ කට්ටි ඉඩම් විකිණීම පෙර වර්ෂවලට වඩා වැඩිපුර සිදුවීම නිසාවෙනි.



# සමස්ත ආදායම්

ඉහත පෙන්වා දුන් වරිපනම් හා බදු ආදායම හා සමස්ත ආදායමෙහි සාරාංශය පහත පරිදි පෙන්වා දිය හැකි ය.

| | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුව (රු.) | ලැබීම් (රු.) | ඇස්තමේන්තුව (රු.) | ලැබීම් (රු.) | ඇස්තමේන්තුව (රු.) | ලැබීම් (රු.) |
| 01. වරිපනම් හා බදු | 8,969,000.00 | 8,814,886.59 | 8,641,200.00 | 8,630,285.04 | 8,561,500.00 | 10,595,823.08 |
| 02. කුලී | 11,255,900.00 | 10,399,929.51 | 11,669,900.00 | 9,737,897.00 | 12,107,800.00 | 11,873,165.86 |
| 03. බලපත්‍ර ගාස්තු | 1,202,900.00 | 827,073.00 | 874,000.00 | 751,567.00 | 1,072,600.00 | 725,134.50 |
| 04. සේවා සඳහා ගාස්තු | 1,157,600.00 | 1,096,737.60 | 1,695,100.00 | 1,003,088.00 | 2,013,000.00 | 1,989,743.48 |
| 05. වරෙන්තු ගාස්තු හා දඩ | 10,333,900.00 | 10,954,680.04 | 7,832,100.00 | 8,686,928.65 | 7,922,100.00 | 9,145,324.49 |
| 06. වෙනත් ආදායම් | 37,396,900.00 | 37,768,338.17 | 20,130,900.00 | 20,258,299.38 | 22,443,200.00 | 3,598,081.67 |
| 07. ආදායම් ආධාර | 43,976,800.00 | 38,252,077.27 | 45,358,300.00 | 42,924,232.10 | 50,337,200.00 | 51,667,214.14 |
| 08. මූලධන අධාර | 9,500,000.00 | 39,105,171.54 | 11,500,000.00 | 26,900,810.60 | 11,501,000.00 | 13,659,974.09 |
| **එකතුව** | **123,793,000.00** | **147,218,893.72** | **107,701,500.00** | **118,893,107.77** | **115,958,400.00** | **103,254,461.31** |





2020 වර්ෂයට වඩා 2022 වර්ෂයේ සමස්ත ආදායම් ඇස්තමේන්තුවේ අඩු වීමක් පෙන්නුම් කරයි. ව්‍යාපෘති සඳහා මූලධන ආධාර නොලැබීමේ හේතුව එයට හේතුව බව පෙන්වා දෙමි. 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අපේක්ෂිත ආදායම් ලැබී ඇති බව පහත ප්‍රස්ථාරයෙන් පෙන්වා දෙමි.

# ස්වයං උත්පාදන ආදායම්

2022 වර්ෂයේ පුනරාවර්තන ආදායමෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු ඇතුළුව ස්වයං උත්පාදන ආදායම් රු. 37,927,273.08 කි.

වැටුප් ප්‍රතිපූර්ණ හා ආයුර්වේද ආධාර රු. 51,667,214.14 කි.







2022 වර්ෂයේ ආදායම් මූලාශ්‍රවලට අනුව මුළු පුනරාවර්තන ආදායමට විවිධ ආදායම් දායක වූ ආකාරය පහත දැක්වේ.

| විෂයය අංකය | ආදායම් වර්ගය | ආදායම | දායකත්වය (%) |
|---|---|---|---|
| 1 | වරිපනම් හා බදු | 10,595,823.08 | 11.82% |
| 2 | කුලී | 11,873,165.86 | 13.26% |
| 3 | බලපත්‍ර ගාස්තු | 725,134.50 | 0.81% |
| 4 | සේවා සදහා ගාස්තු | 1,989,743.48 | 2.22% |
| 5 | වරෙන්තු ගාස්තු හා දඩ | 9,145,324.49 | 10.20% |
| 6 | වෙනත් ආදායම් | 3,598,081.67 | 4.02% |
| 7 | ආදායම් ආධාර | 51,667,214.14 | 57.67% |
| | **එකතුව** | **89,594,487.22** | **100%** |

## 2022 වර්ෂය





# වියදම් විශ්ලේෂණය

| වර්ෂය | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| වියදම | ඇස්තමේන්තුව (රු) | වියදම (රු) | ඇස්තමේන්තුව (රු) | වියදම (රු) | ඇස්තමේන්තුව (රු) | වියදම (රු) |
| 01. වැටුප් හා වේතන | 59,980,300.00 | 50,151,523.50 | 60,306,100.00 | 53,951,755.13 | 67,101,400.00 | 64,191,252.95 |
| 02. ගමන් වියදම් | 1,161,600.00 | 883,411.97 | 1,076,200.00 | 542,703.20 | 881,500.00 | 860,348.99 |
| 03. සැලසුම් හා උපකරණ | 9,490,200.00 | 8,260,092.46 | 8,899,100.00 | 6,148,930.08 | 9,595,300.00 | 11,582,376.92 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 7,340,100.00 | 5,792,762.53 | 7,265,000.00 | 4,290,031.17 | 8,715,000.00 | 4,035,111.45 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් අවශ්‍යතා | 7,603,100.00 | 4,515,459.20 | 9,124,900.00 | 3,989,969.99 | 7,588,200.00 | 4,321,800.45 |
| 06. පොලී ගෙවීම ලාභාංශ හා ප්‍රසාද මුදල් | 1,055,700.00 | 1,055,700.00 | 1,022,700.00 | 1,094,606.44 | 987,100.00 | 986,919.30 |
| 07. ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 2,583,100.00 | 468,757.35 | 2,158,100.00 | 1038420.64 | 2,205,300.00 | 455,649.55 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා දායක මුදල් | 1,611,500.00 | 938,435.00 | 1,307,100.00 | 952,921.81 | 1,559,000.00 | 1,090,220.00 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | 90,825,600.00 | 72,066,142.01 | 91,159,200.00 | 72,009,338.46 | 98,632,800.00 | 87,523,679.61 |
| 09. නව උපකරණ වැය ඉඩම් සංවර්ධන හා ගොඩනැගිලි | 26,862,000.00 | 22,854,484.28 | 4,402,000.00 | 7,437,356.30 | 5,150,000.00 | 1403684.97 |
| **මූලධන වියදම්** | 9,500,000.00 | 38,985,744.11 | 11,500,000.00 | 23,928,168.07 | 11,500,000.00 | 13336081.88 |
| 10. ණය ආපසු ගෙවීම | 607,500.00 | | 607,500.00 | | 675,400.00 | |
| **මුළු වියදම් එකතුව** | **127,795,100.00** | **133,906,370.40** | **107,701,200.00** | **103,374,862.83** | **115,958,200.00** | **102,263,446.46** |



2022 වර්ෂයේ පුනරාවර්තන වියදම් විශ්ලේෂණය හා මුළු පුනරාවර්තන වියදමට විවිධ වියදම් ශීර්ෂ දායක වූ ආකාරය පහත ප්‍රස්ථාර මගින් දැක්වේ.



## වැටුප් හා වේතන (101)

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 96 දෙනෙකුගේ වැටුප් හා වේතන ගෙවීම් කරනු ලබන අතර 2020 වර්ෂයට වඩා 2021 වර්ෂයේ රු. ලක්ෂ 38 වැටුප් හා වේතන වියදම වැඩි වී ඇත. එයට 2021 වර්ෂයේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර කිරීම ද 2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේ ලක්ෂ 102 වැටුප් හා වේතන වැඩි වීමක් පෙන්නුම් කිරීමට හේතුවූයේ සමස්ත රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමයි.

## ගමන් වියදම් (102)

2020 ගමන් වියදම් සදහා වූ ඇස්තමේන්තු 2022 වර්ෂයේ මුදලට වඩා රු.280100 කින් අඩු වී ඇති අතර ගමන් වියදම් සදහා ගෙවූ වටිනාකම 2020 වර්ෂයට වඩා 2021 වර්ෂයේ රු. 340708 අඩු වී ඇත. රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පැවති නිරෝධායන ඇදිරිනිතිය නිසා කාර්යාල කටයුතු සීමා වීම නිසා ගමන් වියදම් අඩු වී ඇත.



## සැපයුම් හා උපකරණ (103)

2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේ සැලසුම් හා උපකරණ සදහා ගෙවූ වටිනාකම ලකෂ 54 වැඩි වී ඇත. රටේ පැවති ඉන්දන සදහා මිල ඉහල යාම මීට හේතුව වී ඇත.

## ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව (104)

2020, 2021, 2022 වර්ෂයන් තුනෙදීම ඇස්තමේන්තු මුදලට වඩා වර්ෂයන් වල වියදම් වටිනාකම අඩු වී ඇත. රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පැවති නිරෝධායන ඇදිරිනිතිය නිසා කාර්යාල කටයුතු සීමා වීම නිසා එම වියදම් අඩු වී ඇත.

## ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් අවශ්‍යතා (105)

2020, 2021, 2022 වර්ෂයන් තුනෙදීම ඇස්තමේන්තු මුදලට වඩා වර්ෂයන් වල වියදම් වටිනාකම අඩු වී ඇත. රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පැවති නීරෝධායන ඇදිරිනිතිය නිසා කාර්යාල කටයුතු සීමා වීම නිසා එම වියදම් අඩු වී ඇත.

## පොළී ගෙවීම ලාභාංශ හා ප්‍රසාද මුදල් (106)

2020, 2021, 2022 වර්ෂයන් තුනෙදීම ඇස්තමේන්තු මුදලට සාපේක්ෂවම වියදම් වටිනාකම විශාල වශයෙන් වෙනස් වී නොමැත.



## ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර (107)

2020, 2021, 2022 වර්ෂයන් තුනෙදීම ඇස්තමේන්තු මුදලින් භාගයකටත් වඩා වර්ෂයන් වල සත්‍ය වියදම් වටිනාකම අඩු වී ඇත. රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පැවති නීරෝධායන ඇදිරිනිතිය නිසා කාර්යාල පුහුණු කටයුතු හා වෙනත් ආයතන මගින් කරන පුහුණු කටයුතු අඩු වීම නිසා එම වියදම් අඩු වී ඇත.

## විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා දායක මුදල් (108)

2020 වර්ෂයට වඩා 2021 වර්ෂයේ රු.ලක්ෂ 5.5 ආධාර මුදල් දායක හා සහනාධාර වියදම වැඩි වී ඇත. එයට 2021 වර්ෂයේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර කිරීම නිසා වැන්දඹු අනත්දරු දායක මුදල් වැඩිපුර අයකිරීම හේතුවිය.

# වත්කම් වගකීම් හා හිමිකම්

## වත්කම්

2022.12.31 දිනට ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ වත්කම්වල වටිනාකම රු.163,843,403.50 කි. ඊට අදාළ සාරාංශය පහත දැක්වේ.

| විස්තරය | මුදල (රු.) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 58,719,477.91 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 62,252,560.12 |
| මෝටර් රථ හා කරත්ත | 33,759,511.68 |
| ලී බඩු හා සවිකිරීම් | 4,066,908.45 |
| පුස්තකාල පොත් ගිණුම | 5,044,945.34 |
| **එකතුව** | **163,843,403.50** |

## වගකීම්

2022.12.31 දිනට සභාවේ මුළු වගකීම් රු. 31,950,236.17 ඊට අදාළ සාරාංශය පහත දැක්වේ. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය මුදලෙහි වාරික ගෙවීම හා අනෙකුත් සැපයුම්කරුවන්ට ගෙවීම සඳහා වෙන්කරන ලද මුදල් මෙහි ඇතුළත් වේ.

| විස්තරය | මුදල (රු.) |
|---|---|
| දේශීය ණය සංවර්ධන අර මුදල | 8412586.74 |
| ආපසු ගෙවියයුතු සේවක ඇප තැන්පත් | 426,366.82 |
| වියදම් ණය හිමියෝ | 18,077,727.67 |
| කලින් ලද ආදායම් | 607,173.10 |
| පුස්තකාල තැන්පත් | 57,425.00 |
| විවිධ තැන්පත් | 4,368,956.84 |
| **එකතුව** | **31950236.17** |


# හිමිකම්


පසුගිය වසර 05 ක හිමිකම් වෙනස් වීම පහත වගුව මගින් විස්තර ඇත.

| වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2018 | 198,427,984.96 |
| 2019 | 297,878,917.35 |
| 2020 | 297,726,752.49 |
| 2021 | 340,387,890.30 |
| 2022 | 329,667,028.44 |



2022 වර්ෂයේ දී ආදායම් ඇස්තමේන්තුවල වෙනසක් නොවුන ද ආර්ථිකයේ සිදු වූ විශාල වෙනස්වීමක් සමග භාණ්ඩ හා සේවාවාවල මිල ඉහළයාම හේතුකොටගෙන වියදම් වැඩිවීම හේතුවෙන් 2021 විර්ෂයට වඩා 2022 වර්ෂයේ දී හිමිකම්වල අඩුවීමක් සිදු වී ඇත.





ශ්‍රී මුරුගන් හින්දු කෝවිල

# 03. සභා කටයුතු



සභාපති/ලේකම් පණිවිඩය

අපගේ මහ සභාව

තීරණ කමිටු

# වැඩ බලන ගරු සභාපතිතුමාගේ පණිවිඩය



සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක් කොට සළකමි.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව 2022 වර්ෂයේ අපේක්ෂා කල පුනරාවර්තන ආදායම මිලියන 104.45ක් වන අතර එයින් වරිපනම් හා බදු ආදායම මිලියන 8.56ක් ද, කුලී ආදායම මිලියන 12.10ක් ද, බලපත්‍ර ගාස්තු ආදායම මිලියන 1.07 ක් ද, සේවා සඳහා ගාස්තු ආදායම මිලියන 2.01 ක් ද, වරෙන්තු ගාස්තු හා දඩ ආදායම මිලියන 7.92ක් ද, වෙනත් ආදායම් මිලියන 22.44ක් ද, ආදායම් ආධාර මිලියන 50.33ක් ද වේ.
මෙයින් හරි අඩක්ම වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ලැබේ. ස්වයං උත්පාදන ආදායම් ඉතිරි මුදල් වන අතර ඒ තුළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ද ඇතුලත් වෙයි.

මේ අනුව 2022 වර්ෂයේ රටේ ආර්ථික අර්බුදයක් පැවතිය ද මිලියන 103.25 ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකි විය. එයින් වැටුප් හා දීමනා සමග මුළු පුනරාවර්තන වියදම මිලියන 87.52ක් වූ අතර ප්‍රාග්ධන වියදම් ලෙස භාණ්ඩ මිලදීගැනීම හා සංවර්ධන ව්‍යාපෘති සඳහා මිලියන 14.73ක වියදමක් දරා ඇත. අප විසින් ආරම්භ කර ඇති කසල කළමනාකරණ වැඩ කටයුතු හා අභිනව ආදාහනාගාරය හරහා ජනතා අවශ්‍යතා ඉටුකිරීමත් වීථි පහන් සවි කිරීම් හා නඩත්තු කටයුතු මෙන්ම දෛනිකව සිදුවන කාර්යයභාරයන් ඉටු කල අතරම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පාරිසරික සුන්දරත්වයෙන් හා ආදායම් සපිරි සභාවක් ලෙසින් ඉදිරියට ගෙන යාමත් එකී මූල්‍ය උත්පාදන ක්‍රියා තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා යෙදවීමටත් හැකියාවක් ලැබුණි.

මෙම කටයුතු සාර්ථක කරගැනීම සඳහා මාහට සහයෝගය දැක් වූ පළාත් පාලන කොමසාරිස්තුමාටත්, සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාටත්, ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියටත්, ප්‍රාදේශීය සභාවේ සියළුම සහෝදර මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ හා ගරු ලේකම්තුමන් ප්‍රමුඛ රාජ්‍ය නිලධාරී සොයුර සොයුරියන්ටත් මාගේ අවංක ආදර ස්තුතිය පලකර සිටිමි.

ඔබට,
තෙරුවන් සරණයි!
සැම දෙවි පිහිටයි!
ඩබ්ලිව්.එල්. රුවන් ලියනගේ
වැඩ බලන සභාපති

# ලේකම්ගේ පණිවිඩය



1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත යටතේ පිහිටුවා ඇති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, වර්ග කි. මීටර් 139 ක වපසරියකින් යුක්ත අතර ග්‍රාම නිලධාරි වසම් 44 ක් පුරා පවුල් 20500 ක් පදිංචිව සිටී.

මෙම පවුල් 20500 නියෝජනය කරමින් ග්‍රාම නිලධාරි වසම් 44 සඳහා කොට්ඨාශ මට්ටමින් 31 කින් යුක්ත මන්ත්‍රී මණ්ඩලයක් පත්ව ඇත. වැඩිමනත් වශයෙන් කිවහොත් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු 29 කින් යුක්ත ගරු මන්ත්‍රී මණ්ඩලයත් ජනතා අභිලාෂයන් ඉටු කිරීමට බැඳී සිටීන ලදී.

ඒ අනුව අපගේ දැක්මට ළඟාවීම සඳහා 2022 වර්ෂයේ අප විසින් කරන ලද ජනතා මෙහෙවර සාර්ථකව හා ගුණාත්මක අන්දමින් කරගෙන යාමට හැකි වූ බව ප්‍රකාශ කර සිටිමි.

ඒ අනුව 2022 වාර්ෂික වාර්තාව උපරිම අයුරින් සකස් කිරීමට දායක වූ හා නිරන්තර විවිධ උපදෙස් ලබාදෙමින් දිරිමත් කරවූ හිටපු ගරු වැඩ බලන සභාපතිතුමා හා ගරු මන්ත්‍රීතුමන්ලාට හා ගරු මන්ත්‍රීතුමියන්ලාටත් පළාත් පාලන කොමසාරිස්තුමාටත්, සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාටත්, විමර්ශන නිලධාරි මහතාටත්, ප්‍රජා සංවර්ධන නිලධාරි මහත්මියටත්, නන් අයුරින් සහය දැක්වූ කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් හා සේවක මහත්ම මහත්මීන් වෙත මාගේ හද පිරි ස්තුතිය පුදකර සිටිමි.

ටී.ආර්.සී.කේ. ගුණසේකර
වැඩ බලන ලේකම්
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

## ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ පල්ලෙ පත්තු ගම් සභාව වශයෙන් පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව 2023.03.19 දින විසුරුවා හරින විට සේවයේ නියුතුව සිටි ජනතා නියෝජිතයින්



වැඩබලන
ගරු සභාපති
ඩබ්.එල්.රුවන් ලියනගේ මැතිතුමා




ගරු සභික මන්ත්‍රී
ආර්.ධනරත්න



ගරු සභික ඩබ්.ඒ.ඒ.
ගුණරත්න



ගරු සභික ඒ.ජී.
හෙට්ටිආරච්චි



ගරු සභික
එස්.කරුණාදාස



ගරු සභික ජී.එච්. එස්.
එන්.විජේසූරිය



ගරු සභික එච්.
කිරිඇල්ල



ගරු සභික
පී.ආරියවංශ



ගරු සභික
එච්.කේ.කේ.එන්.රේණුකා



ගරු සභික
එච්.ටී.තිලකරත්න



ගරු සභික
ආර්.කරුණා



ගරු සභික ඩබ්.ටී.ටී.
පුෂ්පකුමාර



ගරු සභික කේ.ජී.
එන්.කස්තුරිආරච්චි



ගරු සභික ආර්.
අරුණකාන්ති



ගරු සභික
එස්.හැන්ඩ්‍රිෂන්



ගරු සභික
එස්.පී.සිරිසේන



ගරු සභික
ආර්.නන්දා



ගරු සභික
ඩබ්.ඩබ්.ඩබ්.පේමචන්ද්‍ර



ගරු සභික
යූ.එල්.එන්.එම්.
රත්නායක



ගරු සභික
එස්.ප්‍රේමචන්ද්‍ර



ගරු සභික
ඩී.සී.එන්.දිසානායක



ගරු සභික ජී.එම්.ඩී.එස්.
කරුණාපාල



ගරු සභික
ආර්.කේ.එම්.රාගී



ගරු සභික
ආර්.ඒ.නන්දසේන



ගරු සභික
කේ.ජී.පී.කුමාරගේ



ගරු සභික
එස්.එල්.ඩී.එස්.
සමරතුංග



ගරු සභික
පී.යූ.එස්.ආර්.
කරුණාරත්න



ගරු සභික
එම්.ඒ.සී.විජේරත්න



ගරු සභික
එස්.එම්.සේනාධිර



ගරු සභික
ආර්.ඩබ්ලිව්.සිරිවර්ධන




ගරු සභික
එම්.පී.වෙලගෙදර




සභා ගර්භය

# කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාවට/ කුරුවිටි කෝරලේ පල්ලෙ පත්තු ගම් කාර්ය සභාවට/ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට මේ දක්වා තේරී පත් වූ සභාපතිවරුන්



ඩී.ආර්. රාමචන්ද්‍ර මහතා


ඩී. අරනෝලිස් කලටුවාව මහතා


එච්.ඒ.පී. කලටුවාව මහතා


එච්.එන්. නන්සොදා මහතා


ජේ.එම්. සමරසිංහ මහතා


ජී.එච්. පොඩියා මහතා


ඩී. සමරක්කොඩි මහතා


එච්.ඩබ්.එච්.ආර්.ඒ. මාරඹ බණ්ඩාර මහතා


එස්.ඩී. ෂෙල්ටන් සමරසේකර මහතා


ජී.එම්. කරුණාපාල මහතා


ඒ.ඩී. සරත් සන්දනායක මහතා


කේ.එල්. රත්නායක මහතා


යුවරාජ් සදේව චන්ද්‍රසේකර මහතා


ඒ.ඩී. සරත් සන්දනායක මහතා



එම්.පී. තිලක් රෝහණ ජයවික්‍රම මහතා

| | |
|---|---|
| කැන්දන්ගමුව සෞඛ්‍ය ආරක්ෂණ සභාව | |
| 01. ඩී.ආර්. රාමචන්ද්‍ර මහතා | 1931 - 1936 දක්වා |
| 02. ඩී. අරනෝලිස් කලටුවාව මහතා | 1936 - 1939 දක්වා |
| 03. එච්.ජ්.පී. කලටුවාව මහතා | 1939 - 1948 දක්වා |
| කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තු ගම් කාර්ය සභාව | |
| 01. එච්.එන්. නන්සොදා මහතා | 1948 - 1951 දක්වා |
| 02. ජේ.එම්. සමරසිංහ මහතා | 1951 - 1956 දක්වා |
| 03. ජී.එච්. පොඩියා මහතා | 1957 - 1960 දක්වා |
| 04. ඩී. සමරක්කොඩි මහතා | 1957 - 1960 දක්වා |
| 05. එච්.ඩබ්.එච්.ආර්.ජ්. මාරඹ බණ්ඩාර මහතා | 1964 - 1977 දක්වා |
| විශේෂ කොමසාරිස් පාලනය 1977 - 1991.06.31 දක්වා | |
| ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | |
| 01. එස්.ඩී. ෂෙල්ටන් සමරසේකර මහතා | 1991.07.01 - 0997.04.14 දක්වා |
| 02. ජී.එම්. කරුණාපාල මහතා | 1997.04.15 - 1999.03.27 දක්වා |
| 03. ඩබ්.එස්. වීරසිංහ මහතා (වැ.බ.සභාපති) | 1999.03.28 - 1999.05.31 දක්වා |
| 04. ජ්.ඩී. සරත් සන්දනායක මහතා | 1999.06.14 - 2001.04.23 දක්වා |
| 05. කේ.එල්. රත්නායක මහතා | 2002.04.24 - 2004.07.23 දක්වා |
| 06. යුවරාජ් සදේව චන්ද්‍රසේකර මහතා | 2004.07.24 - 2006.04.14 දක්වා |
| 07. ජ්.ඩී. සරත් සන්දනායක මහතා | 2006.04.15 - 2015.05.15 දක්වා |
| විශේෂ කොමසාරිස් පාලනය 2015.05.16 - 2018.03.19 දක්වා | |
| ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | |
| 01. එම්.පී. තිලක් රෝහණ ජයවික්‍රම මහතා | 2018.03.20 - 2022.05.16 දක්වා |
| 02. රුවන් ලියනගේ (වැ.බ.සභාපති) | 2022.05.17 - 2023.03.19 දක්වා |

සභාපති කාමරය



# සංවිධාන ව්‍යුහය



සභාව
කමිටු
මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව
ප්‍රසම්පාදන කමිටුව
නිවාස හා ප්‍රජාසංවර්ධන කමිටුව
සෞඛ්‍ය සනීපාරක්ෂාව, අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව
වෙළඳපල පිළිබඳ උපදේශක කමිටුව
කාර්මික සේවා කමිටුව
විදුලිය,ජලය,රථවාහන නැවතුම්,පදික වෙළදාම් පිළිබඳ කමිටුව
පරිසර හා පහසුකම් පිළිබඳ කමිටුව
සභාපති
ලේකම්
ප්‍රධාන කළමනාකරණ සහකාර
ප්‍රජා සෞඛ්‍ය සේවා අංශය
ආදායම් හා ගිණුම් අංශය
ආයතන අංශය
සැලසුම් හා සංවර්ධන අංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී
ආදායම් පරිපාලක
වෙළෙඳපොල භාරකරු
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර නිලධාරී
කාර්යාල කාර්ය සහායක
කාර්යාල මුරකරු
සංවර්ධන නිලධාරී
රියදුරු
කළමනාකරණ සහකාර නිලධාරී
විදුලි කම්කරු
කාර්මික නිලධාරී
ට්‍රැක්ටර් රියදුරු
මාර්ග කම්කරු අධීක්ෂක
මාර්ග කම්කරු
සෞඛ්‍ය කම්කරු අධීක්ෂක
සෞඛ්‍ය කම්කරු
ආයුර්වේද වෛද්‍ය නිලධාරී
ඖෂධ සංයෝජක
ආයුර්වේද සහායක
කම්කරු
මුරකරු
පුස්තකාලාධිපති
පුස්තකාල සහායක
කාර්යාල කාර්ය සහායක

# තීරණ කමිටු

**අප ආයතනයේ මෙහෙවරට ළඟාවීම සඳහා සභාපතිතුමා ඇතුළු මහ සභාව හා සභාව විසින් පිහිටුවාගෙන ඇති විවිධ කමිටුවලින් ගන්නා වූ තීරණ, වඩාත් කාර්යක්ෂමව හා සඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය ගන්නා වූ වෑයම අතිමහත් ය.**

## සැලසුම් කමිටුව

| | නම | සහභාගීත්වය |
|---|---|---|
| 2022<br><br>කමිටුව පැවැත් වූ වාර ගණන 09 | එම්.පී.තිලක් රෝහණ ජයවික්‍රම මැතිතුමා (ගරු සභාපති) | 02 |
| | ඩබ්ලිව්.එල්.රුවන් ලියනගේ මැතිතුමා (වැ.බ. සභාපති) | 07 |
| | ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා (ලේකම්) | 09 |
| | කේ.එම්.අයි.එස්.රූපසිංහ මයා | 05 |
| | එච්.එම්.පී.එච්.මැණිකේ මිය (සැලසුම් නිලධාරි - නා. සං. අධිකාරිය) | 04 |
| | එච්.ජී.ඒ.එස්.ජී.හන්තාපිටිය මයා (පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක) | 09 |
| | එම්.ඒ.සී.ප්‍රියශාන්ත මයා (කාර්මික නිලධාරි - මාර්ග සං. අධිකාරිය) | 02 |
| | කේ.ජී.සරත් චන්ද්‍රසිරි මයා (කාර්මික නිලධාරි) | 09 |

### අරමුණ

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා නිවාස සහ නගර නිර්මාණ ආඥා පනතේ නීති රීති වලට අනුකූලව ද, නාගරික බල ප්‍රදේශයට අයත් ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරී පනතේ නීති රීති වලට අනුකූලව ද, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට යටත්ව හා මාර්ග සංවර්ධන අධිකාරියේ නීති රීති රෙගුලාසි වලට යටත්ව සහ අනෙකුත් රාජ්‍ය ආයතන වල නීති රීති වලට අනුකූලව සිදු කරන සියළුම ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා දීම මෙම කමිටුව විසින් සිදු කරයි.

# විගණන හා කළමනාකරණ කමිටුව

| | නම | සහභාගීත්වය |
|---|---|---|
| 2022<br><br>**කමිටුව පැවැත් වූ වාර ගණන**<br>04 | රුවන් ලියනගේ මහතා<br>(ගරු සභාපති) | **04** |
| | ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා<br>(ලේකම්) | **04** |
| | බී.එච්.එන්.පී.ජයසූරිය මයා<br>(විගණන පරීක්ෂක) | **04** |
| | අමාලි වික්‍රමතන්ත්‍රී මිය<br>(අභ්‍යන්තර විගණන නිලධාරී) | **04** |
| | ඉන්දිකා නිලූෂි සෝමරත්න මිය<br>(ප්‍රජා සංවර්ධන නිලධරී) | **04** |
| | එස්.ඩබ්.බී.එන්.අමරසිංහ මයා<br>(විමර්ශන නිලධාරී) | **04** |
| | ඊ.එම්.ඩබ්.කරුණාරත්න මිය<br>(ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී) | **04** |
| | ඉනෝකා ගුණසේන මිය<br>(සංවර්ධන නිලධාරී) | **04** |

## අරමුණ

පළාත් පාලන ආයතන නිරන්තරයෙන්ම විගණන විමසුම්වලට යොමු වන බැවින් ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ අරමුණ වේ. විගණකාධිපතිගේ හා අභ්‍යන්තර විගණනයේ උපදෙස් හා මගපෙන්වීම, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශණ හා ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් අප ආයතනයේ වියදම් පාලනය කරමින් ආදායම් ක්‍රමවත්ව පවත්වාගනිමින් මෙම කමිටුව වසරේ කාර්තු 04 ක් තුළ පවත්වාගෙන යාමයි.



## මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව

**අරමුණ**

මූදල් හා සම්බන්ධ ගෙවීම් හා තීරණ ගැනීමේ දී විනිවිද භාවයකින් යුක්තව කටයුතු කිරීම සඳහා පිහිටුවා ඇති මෙම කමිටුව මගින් රුපි.5,000.00 ට වැඩි රු. 500,000.00 ට අඩු ගෙවීම් සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකරයි. සභාවේ ගරු සභාපතිතුමා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ‍ඉසභාපතිත්වය දරමින් මුලසුන හොබවන අතර මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 6 ක් සමග මුළු සාමාජික්ව ගණන 7කි. සභාවේ ගරු ලේකම්ගේ හෝ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිගේ සහභාගිත්වය අනිවාර්ය වන අතර අවස්ථානුකූලව විෂය නිලධාරින්ගේ සහභාගිත්වය සිදු වේ.

## ප්‍රසම්පාදන කමිටුව

**අරමුණ**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා අනුමත පිරිවිතරවලට අනුව වඩා ලාභදායී ආකාරයට මිලදී ගැනීමට අවශ්‍ය හොඳම ගැනුම්කරු තෝරාගැනීම සම්බන්ධ තීරණ ගැනීම සඳහා පිහිටුවා ඇති ප්‍රසම්පාදන කමිටුව මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 7 කින් සමන්විත වේ.

## නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

**අරමුණ**

වඩා සුහදශීලී, කාර්යක්ෂම, සේවාවක් සැපයීම තුළින් මහජනතාවගේ ගැටළුවලට වඩාත් ඵලදායී විසඳුම් ලබා දීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති මෙම කමිටුව මගින්, අනතුරුදායක ගස් සම්බන්ධ ගැටළු, මාර්ග සම්බන්ධ ගැටළු, අනවසර ඉදිකිරීම් සම්බන්ධ ගැටළුවලට අවධානය යොමුකරනු ලබයි. මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 7 කින් සමන්විත මෙම කමිටුවට අවස්ථානුකූලව විෂය නිලධාරින්ගේ සහභාගීත්වය සිදු වේ.

## සෞඛ්‍ය, සනීපාරක්ෂාව, ඝන අපද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය වෙළඳපල පිළිබඳ උපදේශක කාරක සභාව

### අරමුණ

ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය හා සනීපාරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ආයතනයේ කටයුතු මෙහෙයවීමේදී මතුවන ගැටළු සම්බන්ධයෙන් ඵලදායි තීරණ ගැනීම උදෙසා මෙන්ම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම සම්බන්ධව අවශ්‍ය තීරණ ගැනීමට පිහිටුවා ඇති මෙම කමිටුව මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 7 කින් සමන්විතවේ.

## කාර්මික සේවා කමිටුව

### අරමුණ

නාගරික කර්මාන්ත, යටිතල පහසුකම් සංවර්ධන, නගර සංවර්ධන සැලසුම්, ක්‍රම සම්පාදන, විශේෂ ව්‍යාපෘති, සම්පත් කළමනාකරණය හා නාස්තිය වැලැක්වීම පිළිබඳ උපදේශක කාරක සභාවක් ලෙස ක්‍රියාත්මක මෙම කමිටුව මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 7 කින් සමන්විත වේ.

## විදුලිය, ජලය, රථවාහන නැවතුම්, පදික වෙළඳාම පිළිබඳ කමිටුව

### අරමුණ

විදුලිය, ජලය, රථවාහන නැවතුම්, පදික වෙළඳාම සම්බන්ධව මහජනතාවගේ ගැටළුවලට වඩාත් ඵලදායි විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති මෙම කමිටුව මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 7 කින් සමන්විත වේ.

## පරිසර හා පහසුකම් කමිටුව

### අරමුණ

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ඇති පාරිසරික ගැටළු වලට කාර්යක්ෂමව විසඳුම් ලබා දීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති මෙම කමිටුව මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් 7 කින් සමන්විත වේ.



බසාර් ජුම්මා මුස්ලිම් පල්ලිය

# 04. ආයතනික කාර්ය සාධනය



- පොදු පරිපාලනය
- සෞඛ්‍ය සේවා
- භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි
- ජල සේවා
- මහජන උපයෝගී සේවා
- සුභ සාධන සේවා

# පොදු පරිපාලනය

**ආයතනයේ සිටින කාර්ය මණ්ඩලයේ ඇති ශක්තීන්, කුසලතාවයන්, දැනුම, අත්දැකීම් ආයතනයේ ඇති වටිනාම සම්පත වේ.**

මනා දක්ෂතාවයන් හා කුසලතාවයන් වලින් පිරිපුන් සේවක පිරිසක් නොමැති නම් ආයතනයට තම අරමුණු හා පරමාර්ථ කරා යාමට අපහසු වේ.

එම නිසා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මානව සම්පත විධිමත් ලෙස යොදවා ගැනීම උදෙසා ආයතනය සඳහා වූ මානව සංවර්ධන සැලැස්මක් පහත පරිදි සකස් කර ඇත. එම සැලැස්ම ආයතනයේ කෙටිකාලීන හා දිගු කාලීන අවශ්‍යතාවයන් ඉලක්ක කර ගෙන සකසා ඇති අතර විශේෂයෙන් පුද්ගල සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබා දී ඇත.

ආයතනික උපායමාර්ගික අරමුණු හා ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සඳහා පුහුණුව හා සංවර්ධනය උපයෝගී කරගන්නා ආකාරය පිළිවෙලින් මෙහි පෙළගස්වා ඇත.

## 01. පුහුණු වැඩසටහන්



## 02. විෂයයන් කලින් කලට මාරු කිරීම

## 03. රාජකාරී ආවරණ තුළින් දැනුම ලබා දීම



දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇති රාජකාරී ආවරණ සටහන

## 04. කාර්ය මණ්ඩල රැස්වීම් වල දී අදහස් හුවමාරු කර ගැනීම




කාර්ය මණ්ඩල රැස්වීම් අවස්ථා කිහිපයක්


## 05. පුහුණුවීම් තුළින් ලබා ගන්නා දැනුම හා අත්දැකීම් වාර්තා කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙනයාම

මෙහි දී අනෙකුත් නිලධාරීන්ට එම පුහුණු ලේඛනය පරිශීලනය කිරීමෙන් දැනුම ලබා ගත හැක.




## 06. ඒ ඒ විෂයන් සඳහා කාර්යපටිපාටි සහිත ලිපි ගොනුවක් පවත්වාගැනීම



## 07. කම්කරුවන් අතර රාජකාරී මාරු කිරීම

# 2022 මානව සංවර්ධන සැලැස්ම

| තෝරා ගත් පුහුණු වැඩසටහන් | ඉලක්කගත කණ්ඩායම | පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණු | කාල පරාසය | අපේක්ෂිත නිපුණතා මට්ටම වෙත ළගා වීම සඳහා වන යාන්ත්‍රණය |
|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම | ද්විතියික හා තෘතියික නිලධාරී කණ්ඩායම් | කාර්යාලයක අරමුණු හඳුනාගැනීම, අරමුණු ඵලදායී ලෙස ඉටුකර ගැනීම, ආයතනික කටයුතු ඉටු කිරීමේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම හා අමාත්‍යාංශය මඟින් අදාල වැඩසටහන් සංවිධානය කිරීම |
| ලිපිගොනුකරණය | ද්විතීයික හා තෘතියික නිලධාරී කණ්ඩායම් | කාර්යාලීය ලිපිගොනු විධිමත් හා ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| වැටුප් සකස් කිරීම | ද්විතීයික හා තෘතියික නිලධාරී කණ්ඩායම් | වැටුප් පිළිබඳව අවබෝධය වර්ධනය කිරීම තුලින් ආයතනවල නිලධාරීන්ගේ ඵලදායිතාව වර්ධනය කිරීම හා ආයතනික කටයුතු නිවැරදිව පවත්වාගෙන යාම. | දින 03 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| නිවාඩු විෂය භාර නිලධාරියාගේ කාර්යභාරය | ද්විතීයික හා තෘතියික නිලධාරී කණ්ඩායම් | නිවාඩු පිළිබඳව අවබෝධය වර්ධනය කිරීම තුලින් ආයතනවල නිලධාරීන්ගේ ඵලදායිතාව වර්ධනය කිරීම හා ආයතනික කටයුතු නිවැරදිව පවත්වාගෙන යාම. | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව | ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | කාර්යාල සේවක සේවයට අදාල මූලික තොරතුරු පිළිබඳ අවබෝධය, රාජ්‍ය ආයතනයන්හි සංවිධාන ව්‍යුහය හා පිළිපැදිය යුතු චර්යාධර්ම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තුව | ද්විතීයික හා තෘතියික නිලධාරී කණ්ඩායම් | පෞද්ගලික ලිපි ගොනුවක් නිවැරදි ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම හා හැකියාව ලබා දීම | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| සභාව සතුමාර්ග පද්ධතිය හදුනා ගැනීම පිළිබද පුහුණු වැඩ සටහන | විෂය නිලධාරීන් හා තාක්ෂණ නිලධාරීන් | මාර්ග නිවැරදිව හදුනා ගැනීම හා ගැටළු අවම කර ගැනීම. | දින 02 | පළාත් පාලන දෙපාර්තමේන්තු ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම වෙත් |
| පළාත් පාලන නීතිය | මහජන නියෝජිතයින්, විධායක හා ද්විතීයික නිලධාරී කණ්ඩායම් | පළාත් පාලන ආයතන පවත්වාගෙන යායුතු ආකාරය, අනුගමනය කල යුතු නීති රීතීන් පිළිබඳ අවබෝධය | දින 03 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| **ඉංග්‍රීසි භාෂාව හා දෙමල භාෂාව පිළිබඳ පුහුණුව** | ද්විතීයික හා ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | භාෂා අවබෝධය | පැය 150/ පැය 100 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති සමාලෝචනය පිළිබඳ පුහුණුව** | විධායක, ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම් | ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය** | විධායක, ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම් | ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරනු ලබන වැඩ, සේවා,සැපයුම් බඳු, විකිණීම් ආදී කාර්යයන්හි විධිමත්බව, ඵලදායී බව, හා කුසලතා වර්ධනය කිරීම | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **විගණන කටයුතු පිළිබඳව පුහුණුව** | විධායක, ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම් | විගණන විමසුම්වලට නිවැරදි හා පිළිගත හැකි පිළිතුරු සකස් කිරීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **ගිණුම් කටයුතු පිළිබඳව පුහුණුව** | විධායක, ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම් | ආයතනයේ ගිණුම්කරණ කටයුතු පිළීබඳව දැනුම ලබාදීම | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **නව විශ්‍රාම වැටුප් නීති පිළිබඳව දැනුවත් කිරීම** | විධායක, ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම් | විශ්‍රාම වැටුප් සකස් කිරීම සම්බන්ධයෙන් මනා දැනුමක් ලබා ගැනීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **අයවැය සකස් කිරීම** | මහජන නියෝජිතයින්, විධායක හා ද්විතීයික නිලධාරී කණ්ඩායම් | වාර්ෂික ආදායම් ඇස්තමේන්තු කිරීම හා වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම හා ආයතනය මඟින් අදාල වැඩසටහන් සංවිධානය කිරීම |
| **බදු පිළිබඳ (වරිපනම්)** | ද්විතීයික නිලධාරී කණ්ඩායම් | බදු අයකිරීම්, වට්ටම් හා දඩ, පැහැරහැරීම් වළක්වාගැනීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **ධනාත්මක චින්තනය** | විධායක, ද්විතීයික, තෘතීයික හා ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | ධනාත්මක සිතුවිලි වර්ධනය හරහා ආයතනයේ ඵලදායිතාව ඉහළ නැංවීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම හා ආයතනය මඟින් අදාල වැඩසටහන් සංවිධානය කිරීම |
| **රසවින්දනය තුලින් මානව ශක්තීන් වර්ධනය** | ද්විතීයික, හා ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | සෞන්දර්ය තුලින් යහපත් දේ දකිමින් හා හඳුනාගනිමින් තම ශක්තීන් වර්ධනය තුලින් ආයතනයේ ඵලදායිතාව ඉහළ නැංවීම | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| **ආයතනික කනිෂ්ඨ සේවකයින් සඳහා අදාල රාජකාරි ආගන්තුක සත්කාර සහ ආචාර විධි පිළිබඳව වැඩමුළුව** | ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | කාර්යාල කනිෂ්ඨ සේවකයින් අදාල රාජකාරි කටයුතු කිරීමේදී ආගන්තුක සත්කාර හා ආචාර විධි පිළිබඳව පුහුණුව | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **ආකල්ප වර්ධන වැඩසටහන** | ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම් | යහපත් ආකල්ප වර්ධනය තුලින් ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව** | ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | ආයතනය සතුව ඇති වාහන හා යන්ත්‍ර සූත්‍ර නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම පිළිබඳව පුහුණුවක් ලබා දීම | දින 01 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **කසළ කළමනාකරණය** | මහජන නියෝජිතයින්, ද්විතීයික හා ප්‍රාථමික නිලධාරී කණ්ඩායම් | කසළ අවම කිරීම, වැළැක්වීම, නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ දැනුවත් කිරීම | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **වෙබ් නිර්මාණකරණය, පරිගණක මෙහෙයුම් පද්ධති, දත්ත විශ්ලේෂණ මෘදුකාංග පිළිබඳ පුහුණු වැඩසටහන්** | විධායක හා ද්විතීයික නිලධාරී කණ්ඩායම් | අයතනයේ විවිධ වාර්තා සකස් කිරීම හා තොරතුරු තාක්ෂණය සම්බන්ධ කටයුතු වඩාත් හොඳින් සිදු කිරීමේ හැකියාව ලබා දීම | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **ආදාහනාගාර පුහුණුව** | කනිෂ්ඨ සේවක හා කාර්මික නිලධාරි | ආදාහනාගාරය ක්‍රියාත්මක ත්ත්වයෙන් පවත්වාගෙන යාම | දින 02 | සභාවේ වියදමින් පුහුණු වැඩ සටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |
| **පුස්තකාල කළමනාකරණය, මාර්ගස්ථ පුස්තකාල වැඩසටහන** | ද්විතීයික නිලධාරී කණ්ඩායම් | පුස්තකාල ව්‍යවස්ථා, නීතිරීති සම්පාදනය, ලේඛන කළමනාකරණය, වැඩ සටහන් සකස්කිරීම සම්බන්ධ දැනුම හා අවබෝධය | දින 02 | ආයතන වෙතින් ලැබෙන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම |



2022 වර්ෂයේ සබරගමු පළාත් සභා පුහුණු ඒකකය මගින් ලබා දෙන ලද පුහුණු වැඩසටහන් වලට අමතරව සභා අරමුදල් වියදම් කර පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර බාහිර ආයතන මගින් ද අත්‍යවශ්‍ය විශේෂ පුහුණුවීම් ලබා දීමට කටයුතු කරන ලදී.

## 2022 වසරේ ලබාදුන් පුහුණු

| ලබාදෙන ලද පුහුණු වැඩසටහන් | මාසය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 11 | 12 |
| ලිපිගොනුකරණය | | | √ | | | | | | | | | |
| වැටුප් සකස් කිරීම | | √ | | | | | | | | √ | | |
| කනිෂ්ඨ සේවක පුහුණු | | √ | √ | | | | | √ | | | | |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තුව | | | | | | √ | | | | √ | | |
| පළාත් පාලන නීතිය | | | | | | | | | | | | √ |
| ඉංග්‍රීසි භාෂාව හා දෙමළ භාෂාව පිළිබඳ පුහුණුව | | | | | | | | √ | √ | √ | √ | √ |
| ක්‍රියාකාරී සැළැස්ම සකස් කිරීම හා ප්‍රගති සමාලෝචනය පිළිබඳ පුහුණුව | | | | | | | | | | | | √ |
| කාර්යාල කළමනාකරණය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි (සේවාරම්භක පුහුණු මගින්) | | | √ | | | | | | | | | |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය | | | | | | | | | | | | √ |
| විගණන කටයුතු පිළිබඳව පුහුණුව | | | | | | | | | | | √ | |
| ගිණුම් කටයුතු පිළිබඳව පුහුණුව (ගිණුම් හා ආදායම් අංශවල සියළු නිලධාරීන් සඳහා) | | | | | | | | | | | | √ |
| නව විශ්‍රාම වැටුප් නීති පිළිබඳව දැනුවත් කිරීම | | | | | | | | | √ | | | |
| අයවැය සකස් කිරීම | | | | | | | | √ | | | | |
| බදු පිළිබඳ (වරිපනම්) | | | | | | | | | √ | | | |
| ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | | √ | | | | | | | | | √ | |
| රසවින්දනය තුළින් මානව ශක්තීන් වර්ධනය | | | | | | | | | √ | | | |
| මාර්ග සිතියම්ගත කිරීම | | | | | | | | | | √ | √ | |
| ආදාහනාගාර පුහුණුව | | | | | | √ | | | | | | |
| පරිගණක පුහුණු | | √ | √ | | | √ | | √ | | | | |
| වාහන හා යන්ත්‍රෝපකරණ නඩත්තුව | | | √ | | | | | | | | | √ |
| කසල කළමනාකරණය | √ | | | | | | | | | | | |
| කර්මාන්ත විෂය සම්බන්ධව | | | | | | | | | | | | √ |

එසේ ලබා දෙන ලද පුහුණු කිහිපයක්

- ගිණුම් පිළිබඳ පුහුණුව
- IT යහමඟ වැඩසටහන
- බයෝ ගෑස් නිපදවීම පිළිබඳ පුහුණුව



ගිණුම් පිළිබඳ පුහුණුව



බයෝ ගෑස් නිපදවීම පිළිබඳ පුහුණුව

## 08. සේවක දිරිගැන්වීමේ වැඩසටහන්

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි මහතාගේ අදහසක් අනුව සේවක අභිප්‍රේරණය හා ඔවුන්ගේ සේවය ඇගයීම සඳහා ත්‍යාග බෙදා දුනි.

සෞඛ්‍ය හා මාර්ග කම්කරු මහත්ම මහත්මීන් මූලික කරගනිමින් සේවක අභිප්‍රේරණය හා ඔවුන් ඇගයීම වෙනුවෙන් ත්‍යාග බෙදාදීමේ උත්සවයක් සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ ප්‍රධානත්වයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එහි අවස්ථාවන් කිහිපයක් පහත ඡායාරූප වලින් දැක්වේ.



මෙවැනි වැඩසටහන් තුලින් මානව සංවර්ධනය වැඩි දියුණු කල ද විශේෂ කුසලතා සහිත (ආදායම් පරිපාලක, මුරකරු වැනි) නිලධාරීන්ගේ හා අනෙකුත් සේවක පුරප්පාඩු සඳහා දැනට සේවයේ යෙදී සිටින වෙනත් අංශවල අය සේවයේ යොදවා ඇති බැවින් විවිධ ක්ෂේත්‍රවල ප්‍රගතියේ අඩුවීමක් ද දක්නට ලැබේ.

# සෞඛ්‍ය සේවා



ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා රෝග හා ශරීරික සෞඛ්‍ය කෙරෙහි සමාජයෙන් ඇති කරන බලපෑම් කෙරෙහි අවධානව යොමු කරමින් ජනතාවට විශිෂ්ට හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීම ප්‍රමුඛ අරමුණ වේ.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ නිරෝගීකම රැකගැනීම සඳහා ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වයන් නිරන්තර අධ්‍යයනය කිරීමත්, යහපත් සෞඛ්‍ය තත්ත්වයක් දිගුකාලීන වශයෙන් රඳවා තබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් සහ විශිෂ්ඨ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාමත් ප්‍රාදේශීය සභාව සතු ප්‍රධාන අරමුණක් වේ.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව මෙන්ම පිරිසිදු නගරයක් නිර්මාණය කිරීම උදෙසා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් අතීතයේ සිටම ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අනාගතයට ගැළපෙන පරිදි යාවත්කාලීන වෙමින් ඉදිරියටම ගමන් කරමින් පවතී.

ප්‍රජාව උදෙසා අපගේ සේවාවන්


- කසල කළමනාකරණ වැඩසටහන්
- රෝග වාහක පාලන සේවා
- ආහාර සුරක්ෂිත හා පරීක්ෂණ සේවා
- පාරිසරික බලපත්‍ර ලබාදීමේ සේවා
- මාතෘ හා ළමා ආරක්ෂණ සේවා
- සුසාන භූමි හා නඩත්තු සේවා
- ආයුර්වේද හා සුවකම් සේවා
- උපදේශන වැඩමුළු හා අධ්‍යාපනික සේවා
- මළ අප ද්‍රව්‍ය කළමනාකරණ සේවා



# කසල කළමනාකරණය

කසල කළමනාකරණයේ දී මූලික පියවර විය යුත්තේ කසල සම්බන්ධයෙන් ජනතාව තුළ පවතින විවිධ චර්යාවන් සහ ඇබ්බැහිකම් වෙනස් කිරීමට කටයුතු කිරීමයි. කසල ජනනය හැකි අයුරින් අවම කිරීම, කසලවලින් නැවත භාවිතා කළ හැකි දේ වෙන් කොට නැවත යොදා ගැනීමට පෙළඹවීම, ප්‍රතිචක්‍රීකරණය, කසල නිතිපතා බැහැර කරවීමට පෙළඹවීම ආදිය එවැනි සැලැස්මක ඇතුළත් කළ යුතු මූලික කරුණු අතර වේ.

ඒ අනුව විධිමත් පරිදි කසල කළමනාකරණය සිදු කිරීම උදෙසා පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියා මාර්ග රැසක් ගෙන තිබේ. එම ක්‍රියා මාර්ගයේ සාර්ථකත්වය හේතුවෙන් පිරිසිදු නගරයක් නිර්මාණය කිරීමට කසල කළමනාකරණ ව්‍යාපෘතියක් වශයෙන් සාර්ථකත්වයක් හිමිකර ගැනීමට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට හැකි වී තිබේ.






පරිසර හිතකාමී ආනන්දනීය නගරයක් නිර්මාණය කිරීමෙහිලා නගරවැසියන්ගේ අනාගත පුනර්ජීවනය යහපත් කර ගැනීමේ අරමුණ ඇතිව නව අදහස් එකතු කරමින් නිර්මාණශීලී ක්‍රියාමාර්ග රැසක් වර්තමානයේ දී ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභාවක් බවට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව පත්වෙමින් තිබේ.



## 01. කසල එකතු කිරීමේ වැඩසටහන්

කසල නිවෙස්වලින් එක්රැස් කිරීමේ සිට එම කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ ක්‍රියාවලිය දක්වා වූ කාරණා රැසක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශය මගින් සිදු කරන අතර, මෙය රජයට ආර්ථික වශයෙන් බරක් නොවන ආකාරයට ක්‍රියාත්මක කිරීමට විශේෂයෙන් කටයුතු කර තිබේ.

ඒ අනුව කසල එකතු කිරීමේ ක්‍රියාවලිය ද නගරය තුළ විධිමත් පරිදි සිදු කරන අතර, කසල වර්ග කළයුතු ආකාරය, කසල බැහැර කිරීම මෙන්ම නොදිරන කසල හා දිරන කසල වශයෙන් කසල වෙන් වෙන්ව එකතු කරනු ලබන දින සහ කාල වකවානු ගැන සඳහන් කාලසටහන් සකස් කර සියලු වැසියන් දැනුවත් කිරීම වර්ෂය මුල දී සිදු කරනු ලබයි.







කසල එකතු කිරීමේ අවස්ථා

## 02. කසල බැහැර කිරීම




ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශයේ කසල එකතු කිරීම කලාප 4කට බෙදා සිදු කරන අතර, සකස් කරන ලද කාල සටහනක් අනුව දිනපතා දිරන කසල එකතු කරනු ලබයි. ඒ සඳහා ට්‍රැක්ටර් 4ක් යොදවා ඇත.

මෙසේ එකතු කරන කසල අවසාන වශයෙන් බේරුවාන ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කසල අංගනයට බැහැර කරනු ලබයි.


එහිදී දිරන කසල කාබනික පොහොර නිශ්පාදනයට යොමු කරන අතර තව දුරටත් කසල වෙන් කිරීමට අවශ්‍ය වූ විට එය ද සිදු කරනු ලබයි



බේරුවාන කසල අංගනය








කසල එකතු කිරීමේ මාර්ග සිතියම හා කාලසටහන ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් පුවරුව

## 03. කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය

වාණිජ්‍ය වටිනාකමක් ඇති ප්‍රධාන කාබනික පොහොර වර්ගයක් ලෙස කොම්පොස්ට් හැඳින්විය හැක. කොම්පොස්ට් නිෂ්පාදනය පරිසරයට, සමාජයට හා කෘෂි කර්මාන්තයට ප්‍රයෝජන අවස්ථා සලසන ක්‍රියාවලියකි. අපද්‍රව්‍ය ක්‍රමවත්ව කළමනාකරණය කරන ක්‍රමවේදයක් ලෙස කොම්පොස්ට් නිෂ්පාදනය පෙන්වා දිය හැකි වේ.

ඒ අනුව බේරුවාන සහ අප ද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට රැගෙන එන කසල අතරින් දිරන කසල උපයෝගී කරගෙන කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබයි. නිපදවනු ලබන කොම්පොස්ට් පොහොර ප්‍රාදේශීය සභා කාර්යාලයේදීම අලෙවි කරනු ලබයි. 2022 වර්ෂයේ දී කොම්පොස්ට් පොහොර කිලෝ 17 462ක් නිෂ්පාදනය කර ඇත. එමෙන්ම එම පොහොරවලින් කොටසක් 2022 වර්ෂයේ දී අලෙවි කර ඇති අතර එම අලෙවියෙන් රු. 238, 640.00ක ආදායමක් ලබා ඇත.



කොම්පෝස්ට් පොහොර
නිෂ්පාදන යන්ත්‍රය

| |
|---|
| නිෂ්පාදිත පොහොර ප්‍රමාණය - |
| **17 462kg** |
| අලෙවි කළ පොහොර ප්‍රමාණය - |
| **12 457kg** |
| අලෙවියෙන් ලද ආදායම - |
| රු. 238, 640.00 |






කොම්පෝස්ට් පොහොර අලෙවි ස්ථානය

## 04. පොලිතීන් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය



පොලිතීන් හා ප්ලාස්ටික් බාහිර පරිසරයේ පිලිස්සීම අහිතකරය. ප්ලාස්ටික් බාහිර පරිසරයේ දී පිලිස්සීමේ දී නිපදවෙන විෂ වායුන් මිනිස් සිරුරට, ශ්වසනයට බාධා ඇති කරයි.



එබැවින් එවැනි කැලි කසල සඳහා ලබාදිය හැකි හොඳම විසඳුමවනුයේ ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමයි.

පොලිතීන්, ප්ලාස්ටික්, වීදුරු ආදිය නැවත ප්‍රයෝජනයට ගත හැකි වටිනාකමක් ඇති සම්පතක් බැවින් නැවත මුදල් බවට හැරවීමට හෝ ඒවා ප්‍රතිචක්‍රීකරණය මඟින් නැවත ප්‍රයෝජනයට ගත හැක.



ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ද මේ වන විට බෙල් යන්ත්‍රයක් යොදා ගනිමින් ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

එමඟින් ආර්ථික ලාභයක් මෙන්ම පොලිතීන් ප්ලාස්ටික් පරිසර හිතකාමී ලෙස යොදාගැනීමට හැකියාව ලැබී තිබේ.



බෙල් යන්ත්‍රය



# රෝග වාහක පාලන සේවා

## 01. ඩෙංගු මර්ධන වැඩසටහන්

ඩෙංගු වසංගතය මේ වන විට ජාතික වසංගතයක් දක්වා වර්ධනය වී ඇත. මේ හේතුව නිසා මේ වන විට ඩෙංගු මර්ධන කිරීමට පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සෘජු දායකත්වයක් ලබා දේ. ඒ අනුව ඩෙංගු උවදුර මර්ධනය කිරීම සඳහා ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය වර්ධනය කිරීමට නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම කටයුතු කරයි.

ඩෙංගු මර්ධන සඳහා ග්‍රාමිය මට්ටමේ  දැනුවත් කිරීම් සිදු කරන අතර පිරිසිදු කිරීම් කටයුතු වලදී බැහැර වන පොලිතීන්, ප්ලාස්ටික් බෝතල්, වීදුරු බෝතල්, පොල් කටු හා යෝගට් කෝප්ප වැනි දේ දිනයක් ලබා දී ට්‍රැක්ටර් මඟින් එකතු කිරීම සිදු කරයි. දෛනික කසල එකතු කිරීම සිදුවන්නේ නාගරික ප්‍රදේශවල පමණක් වුවද ඩෙංගු මර්ධන වැඩසටහන් යටතේ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට නොදිරන කසල ක්‍රමවත්ව බැහැර කිරීමට අවස්ථාවක් හිමි වන අතර ඩෙංගු බෝවන ස්ථාන විනාශ කිරීමට එමඟින් මහඟු පිටිවහලක් ලැබී ඇත. ඩෙංගු මර්ධනය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා එක්ව ශ්‍රමදාන කටයුතු සිදු කරනු ලබයි.

ඩෙංගු මර්ධනය පිළිබඳ ජනතාව තුළ යහපත් පුරුදු වර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමේ සිට දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර එමඟින් ක්‍රමවත්ව කසල බැහැර කිරීමට දරුවන් පුරුදු කිරීම අපේක්ෂා කෙරේ.



ඩෙංගු මර්ධන ශ්‍රමදාන අවස්ථා

## 02. විෂබීජහරණය

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා ප්‍රාදේශීය සභාව එක්ව 2022 වර්ෂයේ එවකට තිබුණු කොරෝනා ඩෙංගු සහ අනෙකුත් වසංගත රෝග වැළැක්වීමට සභා බල ප්‍රදේශය තුළ විෂබිජහරණ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරුණි.

රජයේ ආයතන, පෞද්ගලික ස්ථාන හා පාසල් වල විෂබීජහරණ කටයුතු ද සේවකයින් සහභාගීත්වයෙන් සිදු කෙරුණි.



විෂබීජහරණ අවස්ථා











## පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම

පරිසර කටයුතු විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළාත් පාලන ආයතනවලට බලය පවරන ලද කාර්යයන් අතරින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ප්‍රමුඛ ස්ථානයක් ගනී. පළාත් පාලන ආයතනවලට බලය පවරන කර්මාන්ත කලින් කලට වෙනස් කරනු ලබන අතර වර්තමානයේ කර්මාන්ත 37ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි. එලෙස නිකුත්කරනු ලබන බල පත්‍රයක් වර්ෂ 3ක් සඳහා වලංගු වන අතර වලංගු කාලය අවසන් වීමට මාස 3කට පෙර බලපත්‍රය අලුත් කළ යුතු වේ. එමගින් පරිසර හිතකාමී ලෙස කාර්මාන්ත පවත්වාගෙන යාමට ජනතාව උනන්දු කිරීම අපේක්ෂා කෙරේ.

## ආහාර සෞඛ්‍ය වැඩසටහන්

ප්‍රාදේශීය වෙළෙඳසැල්වල අලෙවි කරනු ලබන ආහාරවල සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වය පරීක්ෂා කිරීම පිණිස ආපනශාලාවල හා හෝටල්වල ආහාර පාර්සල් පරීක්ෂාව, සනීපාරක්ෂණ තත්ත්වයන් පිළිබඳ නිරන්තර වැටලීම සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හා ඒකාබද්ධව සිදු කරනු ලබයි. එහිදී සෞඛ්‍ය ආරක්ෂිත නොවන ආහාර අලෙවි ආයතනවලට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි. එමගින් සෞඛ්‍යාරක්ෂිත ලෙස ආහාර ලබා ගැනීමට ජනතාවට හැකියාව ලැබී තිබේ.

## මළ අපද්‍රව්‍ය කළමනාකරණය

මළ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ප්‍රාදේශීය සභාවක් සතු වගකීමක් ලෙස පෙන්වාදිය හැකි වේ. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතුව ගලි බවුසර් දෙකක් ඇති නමුත් මළ අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැත. මේ වනවිට ඒ සඳහා අවශ්‍ය භූමිය අත්පත් කරගැනීමේ කටයුතු සාර්ථකව සිදුකරමින් පවතී. ඉදිරියේ දී එම සේවාව ජනතා අයිතියට පත් කිරීමට අපේක්ෂා කෙරේ. නමුත් දැනට අප ආයතනය ඉදිරිපිට දැන්වීම් පුවරුවක් මගින් එම සේවාව ලබා ගත හැකි ආයතන පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සිදු කරනු ලැබේ.

## රුක් රෝපණ වැඩසටහන්

2022 වර්ෂයේ සිදු කරන ලද රුක් රෝපණ වැඩසටහන

- ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව, මෝරගල දෙමළ විද්‍යාලය හා සන්දලැන්ඩ් වතුයාය කලෙමහල් අරනෙරි පාඨශාලා ඒකාබද්ධව පවත්වන ලද රුක් රෝපණ වැඩ සටහන
- ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව හා කලහෙල් අරනෙරි පාඨශාලයෙ එක්ව සමරනු ලැබූ තෛපොංගල් උත්සවය
- ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව හා සන්දලැන්ඩ්වත්ත එක්ව සිදු කරන ලද ආයුර්වේද සෞඛ්‍ය සායනය
- ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යංශය හරහා ප්‍රතිලාභීන්ට සහල් මළු ලබා දීම
- වව්නියා කාවේරි කලා මණ්ඩම් එක්ව පාසල් සිසුන්ට පාසල් උපකරණ බෙදා දීම
- මෝරගල සඳලැන්ඩ්වත්ත මුත්තුමාරි අම්මාන් කෝවිලේ ශ්‍රමදාන වැඩසටහන






## ආයුර්වේද සේවා

ආයුර්වේද දේශීය වෛද්‍ය ප්‍රතිකාර කටයුතු වෙනුවෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ආයුර්වේද 04 කි.

- දිවුරුම්පිටිය
- දම්මුල්ල
- හේවාහින්න
- කීනගහවිල

ග්‍රාමීය හා නාගරික පරිසරයේ ජීවත්වන සෑම වැසියෙකුටම මෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත මහජනතාවගේ රෝගී අවශ්‍යතා සඳහා ප්‍රතිකාර ලබාගැනීමට හැකියාව ලැබී ඇත. මෙහි ආයුර්වේද වෛද්‍යවරුන් දෙදෙනෙකු හා සේවකයින් යොදවා ඇත.

2022 වර්ෂයේදී ආයුර්වේද ආධාර වශයෙන් රු.37,000 ක වටිනාකමැති බෙහෙත් තොග අප වෙත ලැබී තිබුණි. එසේම වාර්ෂික ඇස්තමේන්තුව මගින් 2022 වර්ෂය සඳහා රු.600,000.00 මුදලක් ආයුර්වේද ඖෂධ සඳහා වෙන්කර තිබූ අතර එයින් ලබාගත් බෙහෙත් තොග ආයුර්වේද බෙහෙත් හා සඳහා බෙදා දී තිබුණි.



දිවුරුම්පිටිය ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය




දම්මුල්ල ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය





# භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි



1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත, නිවාස හා සංවර්ධන ආඥා පනත හා නගර හා ග්‍රාම නිර්මාණ පනත යන මූලික පනත් හා නීති-රීති යටතේ බලය පැවරේ.
මේ යටතේ බලය පැවරෙන කාර්යයන්

- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සතු සියළු ඉඩම් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා නඩත්තු කර පවත්වාගෙන යාම
- මංමංවත්, වීථි පහන්. පාලම් ආදිය පැලසුම් කිරීම, ඉදි කිරීම, පුළුල් කිරීම, නඩත්තු කිරීම මෙමගින් සිදු කෙරේ.

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මඟින් ඉටු කරන ලද සංවර්ධන ව්‍යාපෘති

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මඟින් ඉටු කරන සංවර්ධන ව්‍යාපෘති සඳහා පහත සඳහන් ආයතන ඔස්සේ ප්‍රතිපාදන වෙන් කර ගනු ලැබී ය.

- ප්‍රාදේශීය සභා අරමුදල්
- පළාත් සභා අරමුදල්
- පළාත් පාලන රාජ්‍ය අමාත්‍යංශ අරමුදල්
- මහා මාර්ග අරමුදල්
- විමධ්‍යගත අරමුදල්

මෙම ආයතන මඟින් වෙන්කර ගන්නා ලද අරමුදල් ඔස්සේ පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති කොට්ඨාශය පුරා ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ සඳහා ජනතා නියෝජිතයන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් වඩාත් ප්‍රමුඛ යෝජනා සඳහා ප්‍රමුකතාවය ලබා දීමක් සිදු කරන ලදී.

උක්ත අරමුදල් ඔස්සේ පහත ව්‍යාපෘති සිදු කිරීම සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රමුඛ ජනතා නියොජිතයන්ගෙන් හා ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ ද නොමද කැපවීම මත සිදු කෙරිනි.

- **මාර්ග සංවර්ධනය කිරීම**
- **ඇලවේලි සුද්ද කිරීම**
- **පොදු ළිං අලුත්වැඩියාව**
- **බස් නැවතුම්පල අලුත්වැඩියාව**
- **කොම්පොස්ට් අංගන නවීකරනය**
- **ආදාහනාගාරය පිහිටි භූමියේ අනු ව්‍යාපෘති**
- **වීථි ලාම්පු සවිකිරීම**
- **ක්‍රීඩාපිටි සංවර්ධනය**

# මාර්ග ව්‍යාපෘති






ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ සංවර්ධනය විය යුතු මාර්ග පිළිබඳව මහජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් හා මහජන නියෝජිතන්ගේ යෝජනා සම්බන්ධව ප්‍රමුඛතාවය අනුව මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරිණි.
ඒ අතර,

- කොන්ක්‍රීට් කිරීම
- ඉන්ටර්ලොග් ඇල්ලීම
- මාර්ග අලුත්වැඩියා
- පැති කානු සැකසීම

ආදිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති අතර ප්‍රධාන කාර්යයන් වේ.

| අනු අංකය | වර්ෂය | මාර්ගයේ ස්වභාවය | සංවර්ධිත දුර M | වැය කරන ලද මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | **2020** | කොන්ක්‍රීට් කිරීම | 1525.3 | 16,244,313.10 |
| | | ඉන්ටර්ලොක් ඇල්ලීම | 49.64 | 450,000.00 |
| 02 | **2021** | කොන්ක්‍රීට් කිරීම | 483.8 | 4,548,611.93 |
| | | ඉන්ටර්ලොක් ඇල්ලීම | 281 | 2008179.86 |
| 03 | **2022** | - | - | - |

**සංවර්ධිත දුර හා වැය කරන ලද මුදල (රු)**



## මාර්ග සිතියම්ගත කිරීමේ වැඩසටහන









1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සභාවට අයත් මාර්ග පද්ධති හඳුනාගෙන ගැසට් කිරීම එක් කාර්යකි. එම කාර්ය ඉටුකරගැනීමේ අරමුණින් ගරු සබරගමු පළාත් හිටපු ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමාගේ අභිමතයකට අනුව සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ ප්‍රධානත්වයෙන් හා මූලිකත්වයෙන් 2022 වර්ෂයේ දී සබරගමු පළාතේ සියලුම ප්‍රාදේශීය සභා ආයතන ආවරණය කරමින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් සභාවේ සේවයේ නියුතු මහත්ම මහත්මීන්ගේ ශ්‍රමදායකත්වයෙන් මේ වනවිට ද සිදු කරගෙන යනු ලබයි.

GIS තාක්ෂණය භාවිතා කර ක්ෂේත්‍ර චාරිකා ඔස්සේ සිදුවන මෙම ව්‍යාපෘතිය මගින් සභා බල ප්‍රදේශයේ සියලුම මාර්ගයන්හි මතුපිට තලයන්ගේ ස්වභාවය, වීදි පහන්, බෝක්කු, පාලම්, පැති බැමි, විශේෂ ස්ථාන යන භෞතිකමය තොරතුරු වඩාත් නිරවද්‍යතාවයෙන් යුතුව වාර්තා කරගැනීමේ අනගි අවස්ථාව හිමිවීම විශේෂත්වයකි. තව ද කාර්යාලීය කටයුතු සඳහා නිරන්තරව වැදගත් වන සභා බල පුදේශයේ එම භෞතික තොරතුරු අන්තර්ගත කරමින් සිතියම් ගත කිරීමේ ක්‍රියාවලියක් සිදු වීම ද මෙම ව්‍යාපෘතියේ තවත් එක් විශේෂත්වයකි.

2022 වර්ෂයේ දී බලාපොරොත්තු වූ අන්දමට ඇතැම් සංවර්ධන කාර්යයන් සිදුකිරීමට හැකි නොවිනි. එයට මූලික හේතුව වූයේ ගෝලීය වශයෙන් පැතිරගිය කොරෝනා වසංගතය- හේතුවෙන් රජයේ ප්‍රතිපත්ති තීරණ වලට අනුව සියළු සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවිණි. තවද අමුද්‍රව්‍ය හිඟයත් භාණ්ඩ මිල ඉහල යාමත් හේතුවෙන් සංවර්ධන කාර්යන් සඳහා කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් වීම අවම විය.

# ජල සේවා

ප්‍රධාන මෙහෙයුමට අදාළව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු මහජනතාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා පිරිසිදු ජලය සැපයීමෙන් ජනතාවගේ නීරෝගීකම ඇතිකිරීම අරමුණ වේ.





ජල මූලාශ්‍ර

- ළිං
- ජල පීලි
- නල ළිං
- ජල උල්පත්

ප්‍රජාව උදෙසා අපගේ සේවාවන්

- ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම

- සභාව සතු ජලය ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ව්‍යාපෘති, ජල මූලාශ්‍ර, පොදු නාන ළිං, බොන ළිං, නාන තටාක, ජල කරාම, ජල උල්පත්, නල ළිං පවත්වාගෙන යාම වැඩි දියුණු කිරීම හා අළුතින් ඉදි කිරීම.

සභාව විසින් පාලනය වන ජල ව්‍යාපෘති දෙකක් පවතී.

**01. ගැටහැත්ත පානීය ජල ව්‍යාපෘතිය**

**02. දිවුරුම්පිටිය නිල් දියවර පානීය ජල ව්‍යාපෘතිය**

මෙයින් නිල්දියවර පානීය ජල ව්‍යාපෘතිය මගින් ජල පාරිභෝගිකයින් 56 දෙනෙකු ද ගැටහැත්ත පානීය ජල ව්‍යාපෘතිය මගින් ජල පාරිභෝගිකයින් 55 දෙනෙකු ද ප්‍රතිලාභ ලබා ගනී.

මෙම ව්‍යාපෘතීන්වල නඩත්තු කටයුතු සඳහා සේවකයින් යොදවා ඇත.

එසේම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රජා සත්කාරක සේවා යටතේ පහත සඳහන් ජල සැපයීම් සිදුකරනු ලබයි.

■ නියඟ කාලය තුළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනතාවගේ ඉල්ලීම්වලට අනුව ජල දුෂ්කරතාවයන් පවතින ස්ථාන කරා ගොස් නොමිලේ ජලය සැපයීම.

■ වෙසක් පොසොන් හා ඇසල මාස හා වෙනත් ආගමික උත්සව පවත්වන අවස්ථාවලදී ජනතාවගේ ඉල්ලීම පරිදි නොමිලේ ජලය ලබාදීම දිම.

■ සබරගමු මහ සමන් දේවාළය මගින් පවත්වන සමන් දේව ප්‍රතිමාව වඩම්මන පෙරහැර සඳහා කහවතුර ඉසීම සඳහා ජලය ලබා දීම.

■ පාසැල් ක්‍රීඩා හා වෙනත් උත්සව සඳහා ජනතා ඉල්ලීම්වලට අනුව ජලය සැපයීම.







දිවුරුම්පිටිය ජල ටැංකිය

තොරණගොඩ සභාව මගින් ඉදිකළ
පොදු නාන ළිඳ

# මහජන උපයෝගිතා සේවා

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතාවයන් සඳහා වෙළඳපොලවල් ඉදිකිරීම, වීදි ආලෝක කිරීම, ආදාහනාගාර ඉදිකිරීම හා ඒවා නඩත්තු කර පවත්වාගෙන යමින් ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය සඳහා අනෙකුත් යටිතල පහසුකම් සැපයීම මෙමගින් සිදුකෙරේ.



ගැටහැත්ත මහජන පොළ

## මහජන පොළ හා කඩ කාමර

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වසම් 44ක් පුරා වර්ග කිලෝමීටර් 139ක වපසරියකින් යුක්තව පිහිටා ඇති බැවින් මහජනතාවගේ හිතසුව පිණිස ඇහැලියගොඩ මහජන පොළට අමතරව දඹුල්ල හා ගැටහැත්ත යන ස්ථානවල මහජන පොළවල් පිහිටුවා ඇත.


එසේම කුලියට දී ඇති කඩ කාමර 62 ක් පවතින අතර ඒවා ඇහැලියගොඩ හා ගැටහැත්ත යන නගරවල ස්ථාන ගතවී ඇත.

එසේම ඇහැලියගොඩ දඹුල්ල හා ගැටහැත්ත යන නගරවල එළුමස් හා හරක් මස් කඩ ද පිහිටුවා ඇති බැවින් මහජනතාවට වඩාත් පහසුවෙන් තමාගේ අවශ්‍යතාවයන් සපුරාගැනීමට හේතු වී ඇත.



දඹුල්ල මහජන පොළ



ඇහැලියගොඩ මහජන පොළ

මෙමගින් ලබා ගන්නා කුලී ආදායම 2020 වර්ෂයේ රු. 10,399,929.51ක් වූ අතර

2021 වර්ෂයේ එම ආදායම රු. 9,737,897.00 බවට පත්ව ඇත.

2022 වර්ෂයේ දී එම ආදායම රු. 11,873,165.8ක් විය.

ඒ අනුව මිලියන 1.47කින් 2020 වර්ෂයට වඩා 2022 වර්ෂයේ කුලී ආදායම වැඩි වී ඇති බව පෙන්වා දෙමි.








විලේගොඩ ආදාහනාගාර සුසාන භූමිය

## සුසාන භූමි හා ආදාහනාගාර

### 01. සුසාන භූමි

අපගේ ප්‍රධාන මෙහෙයුමට අදාලව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මගින් බල ප්‍රදේශයේ මහජනතාවට අත්‍යවශ්‍ය සේවාවක් වන සුසාන භූමි 11ක් පවත්වාගෙන යනු ලබයි.

එහි නඩත්තු හා අලංකරණ කටයුතු සඳහා අප ආයතනය විසින් සේවකයින් යොදවා ඇත.

### 02. ආදාහනාගාර

මෘත දේහයන් භූමදානය කිරීමට හෝ ආදාහනය කිරීමට ගෘහ ආශ්‍රිත ඉඩකඩ නොමැත. එබැවින් දේහයන් ආදාහනය කිරීමට අවශ්‍යතා ඇති ජනතාව වෙනුවෙන් ඇහැලියගොඩ විලේගොඩ සුසාන භූමියේ ආදාහනාගාරයක් ස්ථාපිත කර ඇත. රු. 15,400,000.00 ක සභා අරමුදල් යොදවා ඉදිකරන ලද මෙම ආදාහනාගාරය ජනතා අයිතියට පත් කර ඇත.

ඇහැලියගොඩ බල ප්‍රදේශයේ හා බල ප්‍රදේශයෙන් පිටත මහ ජනතාව සඳහා විවෘතව පවතින අතර බල ප්‍රදේශයේ ජනතාව සඳහා සහනදායී මිලකට මෘත දේහයන් ආදාහනය කිරීමට ඉඩ සලස්වා ඇති අතර, බල ප්‍රදේශයෙන් පිටත ජනතාව සඳහා ද, දැරිය හැකි මුදලකට මෘත දේහයන් ආදාහනය කිරීමට සලස්වා ඇත.





විලේගොඩ ආදාහනාගාරය

මෙසේ මෘත දේහයන් සඳහා මුදලක් අයකල ද එම මුදල ඉක්මවා සභාව මගින් පිරිවැයක් දරණ බැවින් එය අප විසින් කරනු ලබන ජනතා සේවයකි. අප ආදාහනාගාරය තුළ දිනකට මෘත දේහ 03 ක් ආදාහනය කිරීමට ඉඩ කඩ සළසා ඇති අතර ඊට වඩා මෘත දේහයන් අප ආදාහනාගාරයට ලැබෙන අවස්ථාවල දී එය වෙනත් ළගම පිහිටි ආදාහනාගාරයන් වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

# වීථි පහන්





වාර්ෂික ඇස්තමේන්තුවෙන් වීථි පහන් අළුතින් මිළදී ගැනීමට හා නඩත්තු කිරීමට මුදලක් වෙන් කරනු ලබයි.

එකී මුදල් යොදවා සෘජු මහජන ඉල්ලීම්වලට හා සභිකයින්ගේ ඉල්ලීම් වලට අනුව අත්‍යාවශ්‍ය ස්ථාන කරා අළුතින් වීදි පහන් මිළදී ගැනීමට හෝ අළුත්වැඩියා කිරීම සිදු කරනු ලබයි.

වීථි පහන් ආලෝකන කටයුතු වරිපනම් බල ප්‍රදේශයෙන් ඔබ්බට ග්‍රාමීය ප්‍රදේශවල ද විහිදී ඇත.

උතුරින් කොළඹ දිස්ත්‍රික් සීමාව දක්වාත් බටහිරින් නැගෙනහිරින් කෑගල්ල සීමාව තෙක් ද දකුණින් කුරුවිට සීමාව තෙක් ද විශාල පරාසයක් තුළ විහිදී ඇත.

මහජන පැමිණිලි ලැබුණ සැනින් හැකි ඉක්මනින් ආලෝක කටයුතු නඩත්තු මහජන ප්‍රසාදය ඇති වන පරිදි අප ආයතනය විසින් සිදු කරනු ලබයි.

බල ප්‍රදේශය තුල වීදි පහන් 1500 ක් මේ වන විට සවිකර ඇත.

# සුභ සාධන සේවා

ඇහැලියගොඩ නාගරික බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ කායික හා මානසික තෘප්තිමත්භාවය ඇති කරලීම සඳහා වඩාත් ගුණාත්මක සේවාවන් ලබාදීම වෙනුවෙන් සුභ සාධන සේවාවන් සැපයීම අඛණ්ඩව අප විසින් සිදු කරගෙන යනු ලබයි.

අප විසින් ලබා දෙන සේවා

- පුස්තකාල සේවා
- උත්සව ශාලා සේවා




## පුස්තකාල සේවා

දැනුම සොයා යන සමාජයක් තුළ මහජන පුස්තකාල මගින් ඉටු කරනු ලබන මෙහෙය අති විශාලය.

එහිදී එම සමාජයේ අවශ්‍යතා අනුව මහජන පුස්තකාල ද අනුවර්තනය වන්නේ නම්, සමාජ දියුණුවට විශාල පිටුවහලක් වේ.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව මගින් උගතුන් බිහි කිරීමේ අරමුණින් එවැනි මහජන පුස්තකාල 04ක් බල ප්‍රදේශය වෙත සේවාවන් ලබා දීමට පවත්වාගෙන යනු ලබයි.

- ඇහැලියගොඩ මහජන පුස්තකාලය
- ගැටහැත්ත මහජන පුස්තකාලය
- පලීගල මහජන පුස්තකාලය
- දම්මුල්ල මහජන පුස්තකාලය



ඇහැලියගොඩ බල ප්‍රදේශයේ හා පිටත ප්‍රදේශවල දරුවන්ට හා වැඩිහිටියන්ට පොත්පත් පහසුවෙන් පරිශීලනය සඳහා මෙම පුස්තකාල පහත පරිදි අංශ වශයෙන් බෙදා පහසුකම් සලසා ඇත.

- බැහැර දෙන අංශය
- විමර්ශන අංශය
- පුවත්පත් හා සගරා අංශය
- ළමා අංශය
- අධ්‍යයන අංශය
- ග්‍රන්ථ සංරක්ෂණ අංශය
- කියවීම් ශාලාව
- මැණික් එකතුව
- සබරගමු කෘති එකතුව
- විශේෂ කෘති එකතුව

## පුස්තකාල මඟින් සිදු කළ වැඩසටහන්

- පුස්කාලයේ ජංගම සේවා පවත්වමින්සේවාවන් ගම් දනව් කරා ගෙනයාම.
- පාඨකයන් සඳහා පොත් බෑදීම් වැඩසටහන් පැවැත්වීම.
- දරුවන් සඳහා ADAC ආයතනය සමඟ එක්ව චිත්‍ර තරගයක් පැවැත්වීම.
- වියළගොඩ ගැහැණු ළමා රැදවුම් මධ්‍යස්ථානය සඳහා පෙර පාසල් ජංගම පුස්තකාල පැවැත්වීම.
- මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.









## උත්සව ශාලා සේවා

### 01. විභාග කටයුතු

ප්‍රදේශයේ දරු දැරියන්ගේ විභාග කටයුතු වල සම්මන්ත්‍රණ සඳහා සහන මිලට ශාලාව ලබා දීම.





### 02. මැහුම් පාඨමාලා

සහන මිලට මැහුම් පාඨමාලා පවත්වාගන යාම සඳහා කාන්තා අභිවෘධිය පිණිස හා ස්වයං රැකියා ලෙස හෝ අමතර ආදායම් උත්පාදන ප්‍රවේශයක් ලෙසෙ ශාලාව ලබා දෙමින් දායක වීම



### 03. වෛද්‍ය සායන

විවිධ රෝගාබාධ වලින් පෙලෙන වතු ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින් පවත්වන ලද වෛද්‍ය සායන වැඩසටහන් සඳහා සහන මිලට ශාලාව ලබාදෙමින් දායකත්වය ලබා දීම.





රැස්වීම් ශාලාව



දෙහිගහපිටිය ක්‍රිස්තියානි පල්ලිය

# 05. යහපාලනය

යහපාලන සංවිධාන ව්‍යුහය
යහපාලන ක්‍රියාකාරකම්
ආයතනික සමාජ වගකීම
තිරසර සංවර්ධන ඉලක්ක
ළඟාකරගැනීම සඳහා
අපගේ කැපවීම

# යහපාලන සංවිධාන ව්‍යුහය


අප ආයතනයේ ඉලක්ක ළඟාකර ගැනීම සඳහා සභාපතිතුමා ඇතුළු මහ සභාව හා කමිටු වලින් ගන්නා වූ තීරණ, දූෂණ හා අක්‍රමිකතාවයෙන් තොරව වඩාත් කාර්ක්ෂමව හා සඵලදායීව ක්‍රියාවට නැංවීම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.



# යහපාලන ක්‍රියාකාරකම්

යහපාලන මූලධර්මවලට අනුව ජනතා මෙහෙවර ඉටුකිරීම සඳහා විනිවිදභාවයෙන් යුක්ත කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් සැපයීමට සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් හැකි වී ඇත.

එය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය පහත පරිදි වේ.






# 01. සහභාගීත්ව සංවර්ධනය



යහපාලන ගුණාංග අතරින් පළමු වැන්න මෙයයි. පාලනය සඳහා ජනතා සහභාගීත්වය වර්ධනය කිරීම මෙහි අදහස වේ.

පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සංවර්ධන හා සේවා වැඩ සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා ජනතා සහභාගීත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ලබයි. එලෙස ජනතා සහභාගීත්වය වර්ධනය කිරීම නිසා පහසුවෙන් අපේක්ෂිත අරමුණු කරා ගමන් කිරීමට හැකියාව ලැබී තිබේ.

> පොදු මහජන සම්පත් වල ආරක්ෂාව
>
> අවම පිරිවැයකින් කටයුතු ඉටුකර ගැනීම
>
> නාස්තිය හා දූෂණය අවම කරගැනීම

එමගින් අප හිමි කර ගත් ප්‍රතිඵල අතර වේ.

## අයවැය ක්‍රියාවලිය සඳහා ජනතාව සහභාගීකරවා ගැනීම

ඒ ඒ වර්ෂයන්හිදී ඉදිරි වර්ෂය සඳහා අයවැය යෝජනා සකස් කිරීමේ දී අයවැය සඳහා නව අදහස් ඉදිරිපත් කිරීමට බල ප්‍රදේශයේ ජනතාවට කාලයක් ලබා දේ. එමගින් ජනතා අවශ්‍යතා හඳුනාගෙන අය වැය කෙටුම්පතට ඇතුළත් කිරීම මත, ජනතාවට හිතදායක අය වැයක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී තිබේ.

## සංවර්ධන සේවා සැලසුම් කිරීමේදී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම

ප්‍රජා මණ්ඩල ක්‍රියාත්මක කරවීම මගින් පාලනය සඳහා මහජන සහභාගීත්වය ඍජුව ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. එම හේතුව නිසා සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දි ඔවුන්ගෙන් ලැබෙන ශ්‍රම දායකත්වය නිසා අඩු පිරිවැයකින් සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීමට හැකිවීම ප්‍රාදේශීය සභාවක් වශයෙන් අප ලැබූ ජයග්‍රහණයකි.

## සභා රැස්වීම් සඳහා මහජන ගැලරි සහභාගීත්වය පුළුල් කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව පාලනය සඳහා ජනතාවගේ සහභාගීත්වය වර්ධනය කිරීමට මහා සභා රැස්වීම පැවැත්වෙන දිනයන්හි මහජන ගැලරිය විවෘත කර ඇති අතර ජනමාධ්‍යවේදීන්ට සහභාගිවීම සඳහා අවශ්‍ය පහසුකම් පුළුල් කර ඇත.

# 02. සම්මුතියෙන් කටයුතු කිරීම



සම්මුතියෙන් කටයුතු කිරීම යනු කාර්යයන් කිරීමට පෙර පුළුල් ලෙස සාකච්ඡා කර මනා ලෙස සංවිධානය කොට මහජන නියෝජනයෙන් සංවිධානය හා ප්‍රජාව සමඟ සාමූහික එකඟතාවයකින් ක්‍රියාවට නැංවීම වේ.

පළාත් පාලන ආයතනයක් වශයෙන් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සංවර්ධන හා සේවා වැඩ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා ජනතා සම්මුතියෙන් කටයුතු කරනු ලබයි. එලෙස ජනතා සම්මුතියෙන් කටයුතු කිරීම නිසා පහසුවෙන් අපේක්ෂිත අරමුණු කරා ගමන් කිරීමට හැකියාව ලැබී තිබේ.

නිවැරදි හා නිරවුල් තීරණ ගැනීමට හැකියාව ලැබීම

මුදල් කාලය හා ශ්‍රමය ඉතිරි වීම

විනිවිදභාවය හා ජනතා විශ්වාසය වැඩි දියුණු වීම

සම්පත් අවභාවිතය අවම වීම

නව අදහස් හා යෝජනා ක්‍රියාවට නැංවිය හැකිවීම

එමගින් අප ළඟා කර ගත් ප්‍රතිඵල අතර වේ.

## මහා සභා රැස්වීම

පක්ෂ විපක්ෂ සියළු මහජන නියෝජිතයින් සමඟ සාකච්ඡා කොට එකඟතාවයකින් යුතුව තීරණ ගැනීම. එහිදී සියළු දෙනා එකඟ නොවන අවස්ථා තිබේ නම් වැඩි ඡන්දයට ප්‍රමුඛතාව දීම

## කමිටු

දේශපාලන හා පරිපාලන මිශ්‍ර සහභාගීත්වයෙන් යුතු කමිටු ක්‍රමයක් තුළින් තීරණ ගැනීමට කටයුතු කිරීම නිසා විනිවිදභාවය හා ජනතා විශ්වාසය වැඩි දියුණු වීම

## ප්‍රජා සාකච්ඡා

නිරාකරණයට අපහසු ගැටළු පවතින අවස්ථාවන්හි එම ගැටළුවට අදාල පාර්ශව ගෙන්වා දෙපාර්ශවය සමඟ සාකච්ඡා කොට සම්මතයකට පත් කිරීමට කටයුතු කිරීම.

# 03. වගවීම



වගවීම යනුවෙන් අදහස් කරනුයේ ආයතනය කරනු ලබන සෑම කටයුත්තක් සම්බන්ධයෙන්ම මහජනතාවට පිළිතුරු දීමට හා වගකීමට බැඳී සිටීමයි.

මෙහිදී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වශයෙන් කරනු ලබන වැඩ හා සේවා සඳහා මහජනයා වෙත ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධවත්, අය කරනු ලබන මුදල් හා වියදම් සම්බන්ධවත්, මහජනයා වෙත වගකීම දරනු ලබයි.

නිසි පටිපාටි අනුව කටයුතු කිරීම

මහජන අපේක්ෂාවන් ඉටු වීම

නිවැරදි බව හා නීත්‍යානුකූල බව තහවුරු වීම

පෞද්ගලික අභිමතය පරිදි කටයුතු කිරීමට නොහැකි වීම

සමානාත්මතාව ආරක්ෂා වීම

කාර්යක්ෂමතාව වැඩි දියුණු වීම

මෙම වගවීම නිසා අප ළඟා කරගත් ප්‍රතිලාභ  අතර වේ.

## සේවා සැපයීම

ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, පනත් හා පවතින චක්‍රලේඛ අනුව කටයුතු කිරීම. මෙහි දී ජනතාවට හැකි ඉක්මනින් සේවා සැපයිම සඳහා පුරවැසි ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කර ඇති අතර ඒ අනුව කටයුතු කිරීම. රාජකාරී කිරීමේ දී නිළධාරීන්ට හා සේවකයින්ට අදාල පරිදි මනා පුහුණුවක් ලබා දී තිබීම.

## තොරතුරු ලබා දීම

මහජනතාවට පළාත් පාලන ආයතනයෙන් අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කරයි. එසේම තොරතුරු පනත අනුව අප ආයතනය භාරයේ පවතින ඕනෑම තොරතුරක් ලබා දීමට හැකි බව ප්‍රදර්ශය කොට ඇත.

## ප්‍රජා ප්‍රතිචාර

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සේවය පිළිබඳ අදහස් දැක්වීමට ප්‍රජා ප්‍රතිචාර පෙට්ටියක් හා පොතක් සකස් කර ඇති අතර මහජනතාව වෙත සිතැගි පරිදි තම යෝජනා චෝදනා හා අදහස් යොමු කළ හැකිය.

## 04. විනිවිදභාවය



ආයතනයේ සියළු කටයුතු විවෘත ලෙස ද ලාභ ප්‍රයෝජන අපේක්ෂා වලින් තොරව ද මෙහෙයවීම මෙයින් අදහස් වේ. මෙහිදී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වශයෙන් කරනු ලබන වැඩ හා සේවා සඳහා මහජනයා වෙත විනිවිදභාවයෙන් යුතුව පහත පරිදි සිදු කරනු ලබයි.

ආදායම් රැස් කිරීම, මුදල් පරිහරණය, භාණ්ඩ හා දේපල භාවිතය සේවා හා සැපයුම් ඉටු කිරීම, දේපල බදු දීම, සේවකයින් බඳවා ගැනීම පිළිබඳ නීති රීති නිවැරදිව පිළිපැදීම

ජනතාවට තොරතුරු දැන ගැනීමේ අයිතිය ක්‍රියාවට නැංවීම

සම අවස්ථා සැළසෙන පෞද්ගලික බැදීම් වලින් තොර කාර්ය පටිපාටි පිළිපැදීම

කාරක සභා කළමනාකරණ කමිටු හා කාර්ය මණ්ඩල රැස්වීම් සෑම මසකම පැවැත්වීම හා සියළු තීරණ ඒවායේ සාකච්ඡා කිරීම

## 05. ප්‍රතිචාරාත්මක බව



ආයතනයක් මගින් ඉටු කළ යුතු වන සේවාවන් හා උවමනා එපාකම් පිළිබඳ සංවේදී වීම හා සාධාරණ පිළිගත හැකි කාලයක් තුළ සේවාවන් ඉටුකර දීම ප්‍රතිචාරත්මක බව ලෙස හැදින්විය හැකිය.

ඇහැලියගොඩ ප්‍රදේශීය සභාව පුරවැසි ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත් කර ඒ අනුව නිශ්චිත කාල සීමාවක් තුළ මහජන සේවා ඉටු කිරීම

පිළිගැනීමේ නිලධාරිනියක් නම් කොට ඇය හරහා මහජන ඉල්ලීම් ඉටු කිරීමට මඟ පෙන්වීම

මහජන පැමිණිළි පෙට්ටියක් හා පොතක් තබා ඒ හරහා පැමිණෙන දුක් ගැනවිලි කඩිනමින් විසඳීමට ක්‍රියා කිරීම

නිලධාරීන් නිවාඩු යන කල්හි වැඩ ආවරණය සඳහා වෙනත් නිලධාරියෙක් පෙනී සිටීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම

# 06. කාර්යක්ෂම බව හා කාර්යන්හි අදාළ බව



ආයතනයක ඵලදායී බව මහජන තෘප්තිය හා විශ්වාසය දිනාගැනීම මත රඳා පවතී. එය ඉහළ නැංවිය හැක්කේ කාර්යක්ෂම උපායමාර්ග පිළිපැදීම මගිනි.

නිශ්චිත කාලවකවානු සහිත සැලැස්මකට අනුව කටයුතු මෙහෙයවීම

කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය වන කාර්ය පටිපාටි රීති අඩංගු උපදෙස් හා මාර්ගෝපදේශ පිළියෙල කර ක්‍රියාවට නැංවීම

සැබෑ උවමනාවන් හඳුනාගැනීමට ප්‍රජා සහභාගීත්වය උපයෝගී කර ගැනීම

විධිමත් ලෙස රාජකාරී හා වගකීම් බෙදාහැරීම, වැඩ අධීක්ෂණ ක්‍රම වර්ධනය ක්‍රියාවට නැංවීම ආදිය මඟින් සමස්ත කළමනාකරණය ශක්තිමත් හා කාර්යක්ෂම වීම

# 07. සාධාරණ බව සහ අන්තර්ගත බව



සෑම සමාජ පන්තියක් අතරම සාධාරණ ලෙස සේවා හා සම්පත් බෙදා හැරීම සේවා සම්පාදනය කිරීම මෙමගින් අදහස් වේ. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ඒ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කරනු ලබයි.

ප්‍රජා උවමනා එපාකම් ගැටළු දුෂ්කරතා හඳුනාගත හැකි සම්බන්ධතා ජාලයක් වර්ධනය කිරීම

වැඩ සහ සේවා පිළිබඳ සැළසුම් සෑම කොටසකටම ප්‍රජා සහභාගීත්වය මත සකස් කිරීම

# 08. නීති ගරුක බව



ආයතනයක් තුළ අණ පනත් අතුරු ව්‍යවස්ථා නීති හා රට තුළ බල පවත්නා නීති රෙගුලාසි වලට අනුව කාර්යයන් ඉටු කිරීම නීතිගරුකභාවය නම් වේ.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ඒ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කරනු ලබයි.

> විගණනය හා විමර්ශනය විසින් පෙන්වා දී ඇති අඩු පාඩු දෝශ දර්ශන වහාම නිවැරදි කිරීම හා යළි ඇති නොවන ලෙස අවශ්‍ය පියවර ගැනීම.
>
> මහජන නියෝජිතයින් හා නිළධාරීන් දැනුවත් කෙරෙන වැඩසටහන් පැවැත්වීම
>
> නියමිත කාලය තුළ ආදායම් වියදම් ගිණුම් වාර්තා සකසා සභා ගත කිරීම
>
> අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට හා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම
>
> පුහුණු වැඩසටහන් මගින් නීතිය පිළිබඳ නිළධාරීන් දැනුවත් කිරීම



# තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අපගේ කැපවීම




01. සියළු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම.

02. කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබා ගැනීම හා තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය.

03. සෑම වයසකම සියලු දෙනාටම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

04. සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

05. ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාව ළඟාකර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

06. සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකිබව හා තිරසාර කළමනාකරණය සහතික කිරීම.

07. දැරිය හැකි විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්ති සඳහා සියලුදෙනා ප්‍රවේශය සහතික කිරීම.


08. ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ හා තිරසාර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය.

09. නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරෝත්තු දෙන තිරසාර තත්ත්වයට පත් කිරීම.

10. පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම.

11. දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාර්ග ගැනීම.

## 01. සියළු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම




මේ සඳහා අපගේ කැපවීම වූයේ,

○ දෛනික මුදල් ගෙවීමේ පදනම මත සෞඛ්‍ය අංශයේ කටයුතු සඳහා බල ප්‍රදේශයේ රැකියා විරහිත පුද්ගලයින් බඳවා ගැනීම.
(කොම්පෝස්ට් අංගනය, කසළ එකතු කිරිම, වෙන් කිරීම, ආදාහනාගාර කටයුතු, රියදුරු ආදී කටයුතු සඳහා)

○ රැකියා විරහිත පුද්ගලයින් සඳහා ස්වයංරැකියා, අවශ්‍ය පුහුණු වැඩසටහන් පවත්වා වෙළඳපළ අවස්ථා සලසාදීම හා එමගින් ආර්ථික තත්ත්වය නංවාලීමට පසුබිම සලසා ඇත.

## 02. කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩි දියුණුව ලබාගැනීම හා තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය




මේ සඳහා අපගේ කැපවීම වූයේ,

○ ගෙවතු වගා ඇති කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්මේන්තුව දායකකරගනිමින් ආයතනයේ කාර්ය මණ්ඩලය, වෙළඳ ප්‍රජාව ඉලක්ක කර දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

○ කෙටි කාලීන ඵලදාව සහිත බෝග හඳුන්වා දී ප්‍රමිතියෙන් යුතු පැල ගෙන්වා දීම.
(පොල්, කෙසෙල්, පළතුරු ආදීය.)

## 03. සෑම වයසකම සියලු දෙනාටම, සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.




මේ සඳහා අපගේ කැපවීම වූයේ,

○ ඩෙංගු අවදානමෙන් තොර ප්‍රදේශයක් තහවුරු කිරිම සඳහා වැඩි අවදානමක් සහිත ප්‍රදේශ සඳහා ධූමායනය කිරීම. නිවෙස්වල ඇති නොදිරන ද්‍රව්‍ය එකතු කිරීමට කටයුතු කිරීම.

○ බල ප්‍රදේශයේ අලෙවි කරන  වියළි හා පිසූ ආහාර ද්‍රව්‍ය වල ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා අදාල වියදම් දැරීම.
(මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ සහායයෙන්)

○ දේශීය වෛද්‍ය සේවය නොමිලේ ලබා දීම.

○ බල ප්‍රදේශයේ කසළ එකතු කිරිම, ඒවා මගින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම, නොදිරන ද්‍රව්‍ය එකතු කර ප්‍රතිචක්‍රීකරණය සඳහා ලබාදීම තුළින් සෞඛ්‍ය ආරක්ෂිතව ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.



## 04. සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

○ නගරයේ පිටත ගම්වල පවත්වාගෙන යන පෙර පාසැල් පාලිකාවන් සඳහා දිරි දීමනා ගෙවීම හා පෙර පාසැල් උපකරණ ලබාදීම.

○ පාසැල් දරුවන්ගේ කඩඉම් විභාග සඳහා විශේෂ සම්මන්ත්‍රණ පැවැත්වීමට ශ්‍රවනාගාර පහසුකම් නොමිලේ ලබා දීම.

○ වෘත්තීය පුහුණු සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික පුහුණුව ලබා දීම.

## 05. ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාව ළඟාකර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

○ බල ප්‍රදේශයේ සියළු දෙනා දැනුමින් පරිපූර්ණ කිරීම සඳහා මහජන පුස්තකාල සඳහා විවිධ පොත් වර්ග, පත්තර, සඟරා පාඨක පරිහරණයට පවත්වාගෙනයාම හා පාඨක සමාජ ඇති කිරීම, ළමා රැඳවුම් මධ්‍යස්ථාන වෙත පොත් රැගෙන ගොස් දීමේ ජංගම සේවා පැවැත්වීම.

○ කාන්තා නිලධාරින් සඳහා මැහුම් පාඨමාලාවක් පැවැත්වීම තුළින් නිවසේ මැහුම් අවශ්‍යතා සඳහා දැනුම ලබා දීම.

○ නවක කාන්තා සභිකවරියන් සඳහා දේශපාලනික හා ආයතනික කටයුතුවලට ක්‍රියකාරීව දායකවීම සඳහා පුහුණු අවස්ථා හඳුන්වා දීම, ඒ සඳහා යොමු කිරීම හා වියදම් දැරීම.

## 06. සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකිබව හා තිරසාර කළමනාකරණය සහතික කිරීම.

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

○ ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයෙන් ජලය ලබා දී නොමැති දිවුරුම්පිටිය හා ගැටහැත්ත ප්‍රදේශ සඳහා නල ජලය ලබා දීම.

○ පරිසර බලපත්‍ර ලබාදීමේ වැඩපිළිවෙල තුළින් කර්මාන්ත හා විවිධ ව්‍යාපාර වලින් පරිසරයට අප ජලය මුදා හරින්නේ ද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම. එසේ මුදා හරින ස්ථාන යථා තත්වයට පත් කරන තෙක් තහනම් කිරීම.

○ ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් කට්ටිකර විකිණීම සඳහා අනුමැතිය ලබා දීමේ දී, ජලය හා සනීපාරක්ෂක පහසුකම් අනිවාර්යයෙන් තිබෙන බවට සහතික කර ගැනීම.

○ පොදු ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් පවත්වාගෙන යාම.

○ පොදු නාන ලිං හා බොන ලිං සකස්කර පවත්වාගෙන යාම.

○ නියං සමයේ ජලය නොමැති ප්‍රදේශ සඳහා ජල බවුසර් මගින් නොමිලේ ජලය ලබා දීමට කටයුතු කිරීම.

## 07. දැරිය හැකි විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්ති සඳහා සියලු දෙනා ප්‍රවේශය සහතික කිරීම.

AFFORDABLE AND CLEAN ENERGY

## 08. ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ හා තිරසාර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය.

INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

- කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම හා භාවිතය සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීම.
- බල ප්‍රදේශයේ ජනතාවට අන්තර්ජාල භාවිතය සඳහා පුස්තකාල වෙත අවශ්‍ය පහසුකම් ලබා දී තිබීම.
- ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා මුහුණු පොත හරහා මහජනතාව වෙත තොරතුරු ලබා දෙන අතර ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම ද එමගින් සිදු කරයි. එසේම විද්‍යුත් තැපැල මගින් ලිපි යොමු කිරීමට ද අවස්ථාව මහජනතාව වෙත ලබා දී ඇත.

## 09. නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරෝත්තු දෙන තිරසාර තත්ත්වයට පත් කිරීම.

SUSTAINABLE CITIES AND COMMUNITIES

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

- ඇහැලියගොඩ නගරයේ දුම්රිය රක්ෂිත ඉඩම්වල අනවසරයෙන් තාවකාලික නිවාස තනාගෙන පදිංචි වී සිටින පවුල් සඳහා බේරුවාන රජයේ ඉඩම්වල, අලුතින් ස්ථිර නිවාස තනා දීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව කටයුතු කිරීම.
- බල ප්‍රදේශයේ සියළු කර්මාන්ත, ව්‍යාපාර හා විශේෂ වෙළඳ ස්ථාන සඳහා පරිසර බලපත්‍ර ලබාගැනීම අනිවාර්යකර තිබීම. එසේ බලපත්‍ර ලබා දීමට පෙර කසළ කළමනාකරණය, වායු දූෂණය, ශබ්ද දූෂණය හා වෙනත් පරිසර හානි සිදුවන්නේ ද යන්න පරීක්ෂා කර එසේ නොවන අයුරින් කටයුතු කරන ස්ථාන සඳහා පරිසර බලපත්‍ර නිකුත් කරන අතර, එවැනි හානි සිදුවන ස්ථානවල හානි නොවන අයුරින් පවත්වාගෙනයාමට කටයුතු කල යුතු ආකාරය පිළිබඳ උපදෙස් හා මගපෙන්වීම මධ්‍යම පරිසර අධිකාරියේ ද සහාය ඇතිව සිදු කිරීම.

## 10. පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම.

RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

- පොලිතින් වලින් හා ප්ලාස්ටික් වලින් පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා යොමු වීමට කාර්ය මණ්ඩලය හා වෙළඳ ප්‍රජාව දැනුවත් කිරීම. උදා: ඉවතලන ප්ලාස්ටික් බෝතල් වලට ඉවත දමන ෂොපින් කවර පුරවා ඒවා මල් පාත්ති ආදියෙහි වටේට බිම සිටුවීම, ගල් වැටි අවශ්‍ය ස්ථාන සඳහා තබා බැඳීමට කටයුතු කිරීම වැනි දේ.
- එකතු කරන පොලිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමට පෙර අවම ඉඩක ඇසුරුම් කිරීම සඳහා බේල් යන්ත්‍රයක් යොදා ගැනීම.

## 11. දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාර්ග ගැනීම.

CLIMATE ACTION

මේ සඳහා අපගේ කැපවීම වූයේ,

- ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී භූමි යෝග්‍යතා සහතිකය අනිවාර්ය කිරීම.
- ආපදා අවස්ථාවලදී  ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා එක්ව ජනතාව දැනුවත් කිරීම හා හදිසි ආපදා තත්ත්ව වලදී අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා සේවකයින් ලබා දීම.
- නියං සමයේ දී ජල අවශ්‍යතාව සඳහා ජල බවුසර් ලබා දීම.



ශ්‍රී ලංකාවෙන් සංචාරක කටයුත්ත කර්මාන්තයක් වශයෙන් වැඩි වර්ධනයක් පටන් ගත්තේ 1960 දශකයේ සිටය. ඉන් පසු එළඹි දශක කිහිපය තුළ විටෙක අඩාලවෙමින් ද විටෙක වර්ධනය වෙමින් ද පැවති එය නූතනයේ අපේ ආර්ථිකයට අඩු වැඩි තරමින් බලපෑම් කිරීමට සමත් වී ඇත.

1977 න් පසුව ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ විවෘතභාවය සංචාරක ව්‍යාපාරයේ දියුණුවට ඉවහල් විය. විවෘත ආර්ථිකය විදේශීය ආයෝජකයන්ට ඉවහල් විය.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කළ හැකි ඓතිහාසික විහාර, කතෝලික සිද්ධස්ථාන, ඓතිහාසික උමං මාර්ග, වන රක්ෂිතයන් හා ඒ අවට වූ ස්වභාවික දිය ඇලි, ස්වභාවික වන සංහාරයත් පාදක කොටගෙන සංචාරක ව්‍යාපාරයේ පෙරගමන් යා හැකි මඟ සළකුණු රාශියකින් සන්නද්ධව පවතී. ඒ හරහා සංචාරක කර්මාන්තය දියුණු කිරීමට ද හැකියාවක් පවතින බව ද පෙනී යයි. එවා නම් පහත පරිදි

## ඇහැලියගොඩ පුරවරයේ සංචාරක ආකර්ෂණීය ස්ථාන





## මදරසිංහාරාමය පුරාණ විහාරය

ඇහැලියගොඩ නගර මධ්‍යයේ පිහිටා ඇති මෙම විහාරය නුවර යුගයේ ඉදිවූවකි. පුරාවිද්‍යාත්මක සංරක්ෂිත ස්ථානයක් වශයෙන් නම් කර ඇති මෙම විහාරස්ථානයේ නුවර යුගයට අයත් බිතුසිතුවම් දක්නට ලැබේ.

## අඹන්ඔළුව රජමහා විහාරය

ඇහැලියගොඩ නගරයට මදක් දුරින් පිහිටා ඇති මෝරගල වසමේ කඳුගැටයක් මත මෙම විහාරය පිහිටා තිබේ. පුරාවිද්‍යාත්මක සංරක්ෂිත ස්ථානයක් වන මෙය අනුරාධපුර රාජ්‍ය කාලයේ රජ කළ වළගම්බා රජු සැඟව සිටි ස්ථානයක් ලෙස සැළකේ. ගල් ලෙනක් තුළ පිහිටා ඇති පැරණි විහාරගෙයි මහනුවර යුගයට අයත් චිත්‍ර දක්නට ලැබේ.





## මාහර පුරාණ විහාරය

වසර 400 ක් පමණ පැරණි මෙම විහාරය ඇහැලියගොඩ නගරයට මදක් නුදුරින් පිහිටි මාහර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා තිබේ. මෙහි විහාරගෙයි ද මහනුවර යුගයට අයත් දුර්ලභ ගණයේ චිත්‍ර රාශියක් දක්නට ලැබේ.

## බිසෝදොළ ඇල්ල

ඇහැලියගොඩ නගරයේ සිට දෙහිඕවිට දෙසට සැතපුම් එක හමාරක් පමණ ගමන් කළ පසු බිසෝදොළ හමු වේ. සීතාවක රාජසිහ රජුගේ බිසෝවරු දියනෑමට මෙම ස්ථානයට පැමිණි නිසා බිසෝදොළ ඇල්ල නමින් ප්‍රසිද්ධ වී ඇත.



## දෙනගමු රජ මහා විහාරය

ඇහැලියගොඩ ඉද්දමල්ගොඩ කොට්ඨාශයේ පිහිටි මෙම විහාරය ද ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයකි. අවසන් මහරහතන් වහන්සේ ලෙස සැළකෙන මලියදේව මහරහතන් වහන්සේගේ දෙන වැඩම කලා යැයි ද සැළකෙන මෙම විහාරස්ථානයේ ද අලංකාර බිතුසිතුවම් රාශියක් දක්නට ලැබේ.





## දියුරුම්පිටිය ක්‍රිස්තියානි දේවස්ථානය

බ්‍රිතාන්‍ය යුගයේ දී ඉදිවූවා යැයි සැළකෙන මෙම ස්ථානය වසර 450 ක් පමණ පැරණි බව සැළකේ. කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගය ආසන්නයේ දියුරුම්පිටිය ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ මෙය පිහිටා තිබේ.

## කලටුවාව ජලාශය

ඇහැලියගොඩ ප්‍රාදේශීය කොට්ඨාශයේ පිහිටා ඇති මෙම ජලාශය බ්‍රිතාන්‍ය සමයේ දී ඉදිකර තිබේ. වර්තමානයේ කොළඹ දිස්ත්‍රික්කයට පානීය ජලය රැගෙන යන්නේ මෙම ජලාශය මගිනි.



## හේවායින්න උමං මාර්ගය

සීතාවක රාජසිංහ රජු සීතාවක රාජධානිය හා සම්බන්ධවන මෙම උමං මාර්ගය හේවායින්න ග්‍රාම නිලධාරී කොට්ඨාශයෙන් ආරම්භ වී සීතාවක බැරැන්ඩි කෝවිල දක්වා ගමන්කළ හැකි ය.


බිසෝදොල ඇල්ල
©Gihan Chamara
Photography

# 06. අපගේ ජයග්‍රහණ



ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ගමන් ඉතිහාසයේ අප මුහුණ දුන් අභියෝග රැසකි. එම අභියෝග හමුවේ රාජ්‍ය සේවකයන් ලෙස අප එකාවන් ව හා එක් සිත්ව නොසැලී කටයුතු කර ලැබූ ජයග්‍රහණ මෙසේ එළි දැක්විය හැකි ය.





# 07. මූල්‍ය වාර්තා

- විගණකාධිපති වාර්තාව
- ආදායම් වියදම් ගිණුම
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
- ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- මූල්‍ය ප්‍රකාශ සටහන්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/EHPS/FA/05/2022/09 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 අප්‍රේල් 26 දින.

ලේකම්,

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

වී.පී.එම්. කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } SGLG/RT/A/EHPS/FA/05/2022/09 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 අප්‍රේල් ... දින.

ලේකම්,

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුද්දර ගාස්තු මුදල් පදනම මත ගිණුම් තබන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ දක්වා තිබුණ ද, ඉකුත් වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.16,984,123ක් උපචිත පදනමට ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභාවෙන් පරිත්‍යාග වශයෙන් ලද රු.950,000ක් වටිනාකමැති බෙලර් යන්ත්‍රය ප්‍රාග්ධනීත කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. එමෙන්ම එම පරිත්‍යාග වටිනාකම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය තුළින් ගලපා නොතිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු දෙකක සමාලෝචිත වර්ෂයට අදාළ පොළිය රු.136,941ක් ගිණුම්ගත කර නොතිබීම හා තවත් තැන්පතුවක පොළී ආදායම රු.191,062ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් සහ වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.54,121කින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.55,981ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම සහ ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත ඉදිරි වර්ෂයේදී ගෙවිය යුතු රු.714,037ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස වෙන්කර දක්වා නොතිබුණි.

(ඊ) ගිණුම් විෂයයන් 06කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.155,357,626ක වෙනසක් විය.

(උ) එකතුව රු. 1,968,712ක් වූ ගිණුම් විෂයයන් 04ක විස්තරාත්මක උප ලේඛන හෝ වෙනත් මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඌ) තැන්පතු ගිණුම් 03ක පවතින එකතුව රු.9,337,414ක හර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට සභාව අපොහොසත් වී තිබුණු අතර, ඊට අදාළ ලිඛිත තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.5 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 (5) | 1995 සිට 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 43කදී ලබාදී තිබූ එකතුව රු.2,001,389ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 (2) | 2017 වර්ෂයට අදාළ එකතුව රු.1,517,600ක් වූ කල් ඉකුත් වූ ටෙන්ඩර් හා විවිධ තැන්පතු නිරවුල් කර නොතිබුණි. |
| (ආ) 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභීන්ට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,070,808ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,982,959ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,561,500 | 10,595,823 | 8,778,931 | 26,327,278 | 8,641,200 | 8,630,285 | 5,263,375 | 24,359,671 |
| කුලී | 12,107,800 | 11,873,166 | 11,742,288 | 1,282,271 | 11,669,900 | 9,737,897 | 8,391,744 | 2,461,380 |
| බලපත්‍ර ගාස්තු | 1,072,600 | 725,135 | 723,885 | 5,250 | 874,148 | 751,567 | 756,317 | 9,750 |
| වෙනත් ආදායම් | 7,378,300 | 7,233,149 | 6,248,096 | 1,961,071 | 4,658,100 | 4,948,316 | 3,750,347 | 2,009,066 |
| | 29,120,200 | 30,427,273 | 27,493,200 | 29,575,870 | 25,843,348 | 24,068,065 | 18,161,783 | 28,839,867 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.28,839,867ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.30,427,273ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.59,267,140ක් වුවද, රැස් කරන ලද ආදායම රු.27,493,200ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 54ක මට්ටමක පැවතුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 76කින් වැඩි වී තිබුණු අතර, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 33කින් සහ 29කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.25,606,759ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.15,181,158ක් වූ වරිපනම් ඒකක 2229ක් ඇතුළත් වී තිබුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.252,930ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 05කට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 155කින් අයවිය යුතු රු.127,459ක් ඇතුළත් වී තිබුණි.

### 2.2.4 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂ 02ක් සඳහා හිඟහිටි කඩකුලී රු.1,097,523ක් අයකර නොතිබුණි.

(ආ) ඇහැලියගොඩ සතිපොළෙන් 2012 වර්ෂය වෙනුවෙන් හිඟහිටි බදු කුලී, අධිකරණ තීන්දුවකට අනුව 2016 අප්‍රේල් වනවිට ගෙවා නිමකළ යුතු වුවද, රු.180,000ක් තවදුරටත් අය වීමට පැවතිණි. එහෙත්, බදුකරුවන් විසින් අධිකරණ නියෝග නොපිළිපැදීමට එරෙහිව අධිකරණය දැනුවත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

ආයතන 05ක් විසින් නව පරිසර බලපත්‍ර ලබා ගැනීමටත්, ආයතන 04ක් විසින් එම බලපත්‍ර අලුත්කර ගැනීමටත් අයදුම්කර 2022 දෙසැම්බර් 31 දිනට මාස 12ත් මාස 02ත් අතර කාලයක් ගත වී තිබුණ ද, එම බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 27,322,623 ක් හා මුද්දර ගාස්තු රු.515,877 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 87කින් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 14ක් හා 04 දෙනෙකුගේ අතිරික්ත පැවැතිණි.

### 3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

සභාව සතු පොදු වැසිකිළියකට අයත් භූමිය, දුම්රිය රක්ෂිතය හරහා පුළුල්කළ විකල්ප මාර්ගයට ඇතුළත් වූ බවට 2012 මැයි මාසයේ දී සභාවේ ලේකම්වරයා විසින් ප්‍රකාශ කර තිබුණ ද, ඊට යාබද ඉඩමේ හිමිකරු විසින් එම ඉඩම තමන් විසින් භුක්ති විඳින බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණි. එසේ තිබිය දී, එම භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පත, 2014 මැයි මාසයේ දී සභාව විසින් අනුමත කර තිබුණි. එහෙත් අයදුම්කරුට එම ඉඩමට ඇති අයිතිය පිළිබඳ තහවුරුවක් 2022 දෙසැම්බර් දක්වාම ලබා ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු නොවූ වාහන 03ක හිමිකාරිත්වය, 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2(i) ඡේදය පරිදි පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) හා (ආ) ඡේද අනුව, 2020 දෙසැම්බර් 31 දිනට පෙර සිදුකළ යුතු වූ ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන 03ක අපහරණ කටයුතු, 2022 සැප්තැම්බර් මාසය දක්වාම නිමකර නොතිබුණි.

(ඇ) සභාව සතුව බැකෝ යන්ත්‍රයක් තිබියදී සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03ක දී බැකෝ යන්ත්‍ර කුලියට ගැනීම සඳහා රු.118,505ක් වැයකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 09කට අදාළව එකතුව රු.14,330,400ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 15කට අදාළව එකතුව රු.8,819,031ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 57 සිට සියයට 93 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ටී.පී.එම්. කුමානායක.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

# ආදායම් වියදම් ගිණුම - 2022.12.31 දිනට

| විස්තරය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | ජලසේවා | වෙනත් උපයෝගිතා සේවා | සුභසාධන සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **(1)පුනරාවර්තන ආදායම්** | | | | | | | |
| 10.වරිපනම් හා බදු | 7,786,282.63 | 474,344.75 | 1,624,072.70 | 243,873.00 | | 467,250.00 | 10,595,823.08 |
| 20.කුලී | | | 230,010.00 | 136,925.80 | 11,399,090.06 | 107,140.00 | 11,873,165.86 |
| 30.බලපත්‍ර ගාස්තු | 320,134.50 | 381,000.00 | 24,000.00 | | | | 725,134.50 |
| 40.සේවා සඳහා ගාස්තු | 208,350.00 | 1,205,250.00 | 519,043.48 | 27,000.00 | | 30,100.00 | 1,989,743.48 |
| 50.වරෙන්තු ගාස්තු හා දඩ | 8,202,733.92 | 21,484.84 | 476,357.98 | | 361,527.50 | 83,220.25 | 9,145,324.49 |
| 60.වෙනත් ආදායම් | 2,724,618.29 | 239,865.00 | 188,794.88 | | 442,774.50 | 2,029.00 | 3,598,081.67 |
| 70.ආදායම් ආධාර | 33,056,173.10 | 10,368,144.29 | 2,982,289.62 | | 531,624.00 | 4,728,983.13 | 51,667,214.14 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **52,298,292.44** | **12,690,088.88** | **6,044,568.66** | **407,798.80** | **12,735,016.06** | **5,418,722.38** | **89,594,487.22** |
| **(2)පුනරාවර්තන වියදම්** | | | | | | | |
| 01.වැටුප් හා වේතන | 34,355,099.01 | 19,522,431.83 | 3,441,000.09 | 66,459.50 | 1,857,756.43 | 4,948,506.09 | 64,191,252.95 |
| 02.ගමන් වියදම් | 577,023.25 | 172,976.14 | 87,809.60 | | 700.00 | 21,840.00 | 860,348.99 |
| 03.සැපයුම් හා උපකරණ | 6,827,284.62 | 3,930,857.30 | 465,935.00 | 3,400.00 | 1,200.00 | 353,700.00 | 11,582,376.92 |
| 04.ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 1,487,266.60 | 2,025,422.27 | 189,698.58 | 173,979.00 | 115,465.00 | 43,280.00 | 4,035,111.45 |
| 05.ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 2,689,268.78 | 949,379.32 | 278,686.88 | 116,992.25 | 194,397.30 | 93,075.92 | 4,321,800.45 |
| 06.පොලී ගෙවීම් හා ලාභාංශ | | | | | 986,919.30 | | 986,919.30 |
| 07.ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 359,272.85 | 20,000.00 | 76,376.70 | | | | 455,649.55 |
| 08.විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා දායක මුදල් | 50,308.00 | 905,487.00 | | | 116,061.00 | 18,364.00 | 1,090,220.00 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **46,345,523.11** | **27,526,553.86** | **4,539,506.85** | **360,830.75** | **3,272,499.03** | **5,478,766.01** | **87,523,679.61** |
| **පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම** | | | | | | | |
| (3)**ප්‍රාග්ධන ආදායම්** | | | | | | | |
| 81.මූලධන ආධාර | 97,817.56 | 6,220,389.86 | 7,183,555.72 | | 65,034.20 | 93,176.75 | 13,659,974.09 |
| **පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම හා ප්‍රාග්ධන ආධාරවල එකතුව** | **6,050,586.89** | **(8,616,075.12)** | **8,688,617.53** | **46,968.05** | **9,527,551.23** | **33,133.12** | **15,730,781.70** |
| **(4) ප්‍රාග්ධන වියදම්** | | | | | | | |
| 09.උපකරණ වැය | 255,550.00 | 561,814.22 | | 26,022.70 | 43,560.00 | 516,738.05 | 1,403,684.97 |
| **මූලධන වියදම්** | | | 13,336,081.88 | | | | 13,336,081.88 |
| **10.දිගුකාලීනණය වාරික ගෙවීම** | | | | | | | |
| **අතිරික්තය හා ඌණතාවය** | **5,795,036.89** | **(9,177,889.34)** | **(4,647,464.35)** | **20,945.35** | **9,483,991.23** | **(483,604.93)** | **991,014.85** |

## 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

| විස්තරය | සටහන | 2022.12.31 දිනට | 2021.12.31.දිනට |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය පුනරාවර්තන | 1 | 51,667,214.14 | 42,924,232.10 |
| වෙනත් අයභාර | 2 | 37,927,273.08 | 49,068,065.07 |
| | | **89,594,487.22** | **91,992,297.17** |
| **මෙහෙයුම් වියදම** | | | |
| පුනරාවර්තන වියදම | 3 | 87,523,679.61 | 72,009,338.46 |
| | | **87,523,679.61** | **72,009,338.46** |
| | | | |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 13,659,974.09 | 26,900,810.60 |
| | | **13,659,974.09** | **26,900,810.60** |
| | | | |
| ප්‍රාග්ධන වියදම | 5 | 14,739,766.85 | 31,365,524.37 |
| | | **14,739,766.85** | **31,365,524.37** |
| | | | |
| **වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය** | | **991,014.85** | **15,518,244.94** |

## 2022.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2022.12.31 දිනට | 2021.12.31 දිනට |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ | 6 | 163,843,403.50 | 162,757,107.25 |
| එකතුව | | **163,843,403.50** | **162,757,107.25** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 7 | 1,378,713.96 | 980,372.32 |
| සේවක ණය | 8 | 10,604,829.80 | 9,999,573.84 |
| ලැබියයුතු දෑ | 9 | 138,273,113.81 | 185,310,005.40 |
| ආයෝජන | 10 | 26,926,366.82 | 16,903,606.68 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 20,590,836.72 | 15,136,259.43 |
| **එකතුව** | | **197,773,861.11** | **228,329,817.67** |
| **මුළු වත්කම්** | | **361,617,264.61** | **391,086,924.92** |
| | | | |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 8,412,586.74 | 9,033,033.54 |
| ජංගම වගකීම් | 13 | 23,537,649.43 | 41,666,001.08 |
| හිමිකම | 14 | **329,667,028.44** | **340,387,890.30** |
| **මුළු හිමිකම** | | **361,617,264.61** | **391,086,924.92** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

# ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය

| විස්තරය | සමුච්චිත අතිරික්තය/ඌණතාවය |
|---|---|
| 2022.01.01 දිනට ශේෂය | 177,630,783.05 |
| පූර්ව කාල පරිච්ඡේදවල වැරදි ගැළපීම | 12,701,965.77 |
| නැවත ප්‍රකාශ කල ශේෂය | 164,928,817.28 |
| වර්ෂයේ ගැළපීම | 0.00 |
| 2022 වර්ෂයේ ලැබීම් | 152,656.30 |
| 2022 වර්ෂයේ ගෙවීම් | 248,863.49 |
| 2022 වර්ෂයේ විස්තීර්ණ ආදායම | 991,014.85 |
| 2022.12.31 දිනට ශේෂය | **165,823,624.94** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

# 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | මුදල | |
|---|---|---|
| 2022.01.01 දිනට මුදල් ශේෂය | | 15136259.43 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | | |
| 10.වරිපනම් හා බදු | 8,778,931.26 | |
| 20.කුලී | 11,742,287.86 | |
| 30.බලපත්‍ර ගාස්තු | 723,884.50 | |
| 40.සේවා සඳහා ගාස්තු | 1,989,743.48 | |
| 50.වරෙන්තු ගාස්තු හා දඩ | 14,459,375.72 | |
| 60.වෙනත් ආදායම් | 18,470,506.06 | |
| 70.ආදායම් ආධාර | 51,645,200.63 | |
| 80.ප්‍රාග්ධන ලැබීම් | 11,604,692.43 | |
| සේවක ණය | 4,493,253.69 | |
| අත්තිකාරම් | 1,473,237.01 | |
| මිශ්‍ර තැන්පත් | 956,884.57 | |
| සමුච්චිත අරමුදල | 152,656.30 | |
| ආදායම් හා වෙනත් ලැබීම් | 23,658.71 | |
| **අඩු කලා-** | **126,514,312.22** | **141,650,571.65** |
| 1.වැටුප් හා දීමනා | 63,160,231.60 | |
| 2.ගමන් වියදම් | 688,441.99 | |
| 3.සැපයුම් හා උපකරණ | 11,630,758.56 | |
| 4.ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 3,663,581.45 | |
| 5.ප්‍රවාහන සම්බන්ධතා ආවශ්‍යක සේවා | 4,045,742.66 | |
| 6.පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 986,919.30 | |
| 7.ආධාර මුදල් ආයක මුදල් හා සහනාධාර | 162,692.00 | |
| 8.විශ්‍රාම වැටුප් විශ්‍රාම දායක මුදල් හා සහනාධාර | 995,164.00 | |
| සේවක ණය | 5,387,174.65 | |
| අත්තිකාරම් | 1,542,747.79 | |
| මිශ්‍ර තැන්පත් | 959,475.28 | |
| සමුච්චිත අර මුදල | 248,863.49 | |
| විවිධ ණය හිමියෝ | 17,920,282.88 | |
| | **111,392,075.65** | **30,258,496.00** |
| මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| ස්ථාවර තැන්පත් | 10,000,000.00 | |
| ස්ථාවර තැන්පත් පොලී | 2,055,983.40 | |
| ප්‍රාග්ධන වැය | 1,048,313.97 | |
| ආයෝජන | 20,000,000.00 | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | 8,992,330.57 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් | | |
| **අඩු කලා -** | | |
| 10. ණය ආපසු ගෙවීම් | 675,328.71 | |
| **සමස්ත ශුද්ධ මුදල් මුදල් ප්‍රවාහය** | | **20,590,836.72** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාවේ 2022.12.31 දිනට පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 171 වැනි වගන්තියට අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභා උප නීතීන් වශයෙන් සම්මත ප්‍රාදේශීය සභා මූල්‍ය රීතීන් වලට අනුගතවෙමින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී උපචිත පදනම මත ගිණුම් තැබීම කර ඇති අතර මුද්දර ගාස්තු ආදායම සඳහා පමණක් මුදල් පදනමින් ගිණුම් සකස් කර ඇත.

සභාවේ ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත නිර්දේශවලින් බැහැරව වත්කම් ගත් වර්ෂයේ 100% ක්ෂය වූවා සේ සලකා මුළු පිරිවැය ආදායම් වියදම් ගිණුමට ප්‍රාග්ධන වියදම් ගිණුමට ප්‍රාග්ධන වියදම් යටතේ ලියා අතහැර ඇති අතර අදාළ වත්කම් ශේෂ පත්‍රයේ නිරූපනය කිරීම සඳහා අදාළ වත්කම් ගිණුමට සිහිවටන සටහනක් මඟින් ගැළපීම් සිදුකර ඇත.

මහා භාණ්ඩාගාරය මතින් නිකුත් කරන ලද 2022.12.19 දිනැති PED/19 නැමැති චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය අංශ ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශන සංශෝධන සහිතව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා භාවිතා කර ඇත.

ආදායම් වියදම් ගිණුම - මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය නමින් සඳහන් කර ඇත.
ශේෂ පත්‍රය - මූල්‍ය තත්ත්ව ප්‍රකාශය නමින් සඳහන් කර ඇත.

සභාවේ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී මුදලේ උද්ධමනකාරී තත්ත්වය හෝ අවධමනකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන නොමැත. මෙම මූල්‍ය ප්‍රකාශන වලින් දැක්වෙන සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

# 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ සටහන්

| අය විෂයයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මං.මාවත්, ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභසාධන සේවා | 2022.12.31 දිනට ශේෂය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| සටහන 01 | | | | | | | | |
| රජයේ දායකත්වය පුනරාවර්තන | | | | | | | | |
| 70. පළාත් සභා/රජයේ දායකත්වය | 33,056,173.10 | 10,368,144.29 | 2,982,289.62 | 0.00 | 531,624.00 | 4,728,983.13 | 51,667,214.14 | 42,924,232.10 |
| **එකතුව** | **33,056,173.10** | **10,368,144.29** | **2,982,289.62** | **0.00** | **531,624.00** | **4,728,983.13** | **51,667,214.14** | **42,924,232.10** |
| | | | | | | | | |
| සටහන 02 | | | | | | | | |
| වෙනත් අයභාර (පුනරාවර්තන ආදායම්) | | | | | | | | |
| 10. වරිපනම් හා බදු | 7,786,282.63 | 474,344.75 | 1,624,072.70 | 243,873.00 | 0.00 | 467,250.00 | 10,595,823.08 | 8,630,285.04 |
| 20. කුලී | 0.00 | 0.00 | 230,010.00 | 136,925.80 | 11,399,090.06 | 107,140.00 | 11,873,165.86 | 9,737,897.00 |
| 30. බලපත්‍ර ගාස්තු | 320,134.50 | 381,000.00 | 24,000.00 | 0.00 | 0.00 | 0.00 | 725,134.50 | 751,567.00 |
| 40. සේවා සඳහා ගාස්තු | 208,350.00 | 1,205,250.00 | 519,043.48 | 27,000.00 | 0.00 | 30,100.00 | 1,989,743.48 | 1,003,088.00 |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ | 8,202,733.92 | 21,484.84 | 476,357.98 | 0.00 | 361,527.50 | 83,220.25 | 9,145,324.49 | 8,686,928.65 |
| 60. වෙනත් ආදායම් | 2,724,618.29 | 239,865.00 | 188,794.88 | 0.00 | 442,774.50 | 2,029.00 | 3,598,081.67 | 20,258,299.38 |
| **එකතුව** | **19,242,119.34** | **2,321,944.59** | **3,062,279.04** | **407,798.80** | **12,203,392.06** | **689,739.25** | **37,927,273.08** | **49,068,065.07** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

| අය විෂයයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | ජලසේවා | වෙනත් උපයෝගී සේවා | සුභසාධන සේවා | 2022.12.31 දිනට ශේෂය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| සටහන 03 | | | | | | | | |
| පුනරාවර්තන වියදම් | | | | | | | | |
| 1. වැටුප් හා වේතන | 34,355,099.01 | 19,522,431.83 | 3,441,000.09 | 66,459.50 | 1,857,756.43 | 4,948,506.09 | 64,191,252.95 | 53,951,755.13 |
| 2. ගමන් වියදම් | 577,023.25 | 172,976.14 | 87,809.60 | 0.00 | 700.00 | 21,840.00 | 860,348.99 | 542,703.20 |
| 3. සැපයුම් හා උපකරණ | 6,827,284.62 | 3,930,857.30 | 465,935.00 | 3,400.00 | 1,200.00 | 353,700.00 | 11,582,376.92 | 6,148,930.08 |
| 4. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 1,487,266.60 | 2,025,422.27 | 189,698.58 | 173,979.00 | 115,465.00 | 43,280.00 | 4,035,111.45 | 4,290,031.17 |
| 5. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 2,689,268.78 | 949,379.32 | 278,686.88 | 116,992.25 | 194,397.30 | 93,075.92 | 4,321,800.45 | 3,989,969.99 |
| 6. පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | | 986,919.30 | 0.00 | 986,919.30 | 1,094,606.44 |
| 7. ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 359,272.85 | 20,000.00 | 76,376.70 | 0.00 | 0.00 | 0.00 | 455,649.55 | 1,038,420.64 |
| 8. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා දායක මුදල් | 50,308.00 | 905,487.00 | 0.00 | 0.00 | 116,061.00 | 18,364.00 | 1,090,220.00 | 952,921.81 |
| **එකතුව** | **46,345,523.11** | **27,526,553.86** | **4,539,506.85** | **360,830.75** | **3,272,499.03** | **5,478,766.01** | **87,523,679.61** | **72,009,338.46** |
| | | | | | | | | |
| සටහන 04 | | | | | | | | |
| 80. ප්‍රාග්ධන ආධාර | 97,817.56 | 6,220,389.86 | 7,183,555.72 | 0.00 | 65,034.20 | 93,176.75 | 13,659,974.09 | 26,900,810.60 |
| **එකතුව** | **97,817.56** | **6,220,389.86** | **7,183,555.72** | **0.00** | **65,034.20** | **93,176.75** | **13,659,974.09** | **26,900,810.60** |
| | | | | | | | | |
| සටහන 05 | | | | | | | | |
| 9. ප්‍රාග්ධන වියදම් | 255,550.00 | 561,814.22 | 0.00 | 26,022.70 | 43,560.00 | 516,738.05 | 1,403,684.97 | 7,437,356.30 |
| 9. මූලධන වියදම් | 0.00 | 0.00 | 13,336,081.88 | 0.00 | 0.00 | 0.00 | 13,336,081.88 | 23,928,168.07 |
| **එකතුව** | **255,550.00** | **561,814.22** | **13,336,081.88** | **26,022.70** | **43,560.00** | **516,738.05** | **14,739,766.85** | **31,365,524.37** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

| විස්තරය | 2022.01.01 දිනට පිරිවැය | 2022 එකතු කිරීම් | 2022 ඉවත් කිරීම් | 2022.12.31.දිනට ශේෂය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| **සටහන 06** | | | | | |
| **දේපල පිරියත හා උපකරණ** | | | | | |
| 111. ඉඩම හා ගොඩනැගිලි | 58,719,477.91 | 0 | 0 | 58,719,477.91 | 58,719,477.91 |
| 112. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 62,184,090.12 | 95920 | 27450 | 62,252,560.12 | 62,184,090.12 |
| 113. මෝටර් රථ හා කරත්ත | 33,759,511.68 | 0 | 0 | 33,759,511.68 | 33,759,511.68 |
| 114. ලී බඩු හා සවිකිරීම් | 3,807,883.45 | 300505 | 41480 | 4,066,908.45 | 3,807,883.45 |
| 115. පුස්තකාල පොත් | 4,286,144.09 | 796091.5 | 37290.25 | 5044945.34 | 4,286,144.09 |
| **එකතුව** | **162,757,107.25** | **1192516.5** | **106220.25** | **163,843,403.50** | **162,757,107.25** |
| | | | | | |
| **සටහන 07** | | | | | |
| තොග | | | | | |
| 121. ආයුර්වේද ඖෂධ තොග | 980,372.32 | 834220.83 | 435879.19 | 1,378,713.96 | 980,372.32 |
| **එකතුව** | **980,372.32** | **834220.83** | **435879.19** | **1,378,713.96** | **980,372.32** |
| | | | | | |
| **සටහන 08** | | | | | |
| **සේවක ණයගැති හා අත්තිකාරම්** | | | | | |
| 140. සේවක ණය | 9,999,573.84 | 5,387,174.65 | 4,781,918.69 | 10,604,829.80 | 9,999,573.84 |
| **එකතුව** | **9,999,573.84** | **5,387,174.65** | **4,781,918.69** | **10,604,829.80** | **9,999,573.84** |
| | | | | | |
| **සටහන 09** | | | | | |
| ලැබිය යුතු දෑ | | | | | |
| 161. හිඟහිටි වරිපනම් බදු | 24,359,670.79 | 9,255,400.32 | 7,286,793.81 | 26,328,277.30 | 24,359,670.79 |
| 162. හිඟහිටි ප්‍රාග්ධන ආධාර | 97,851,094.50 | 2,055,281.66 | 11,280,800.22 | 88,625,575.94 | 97,851,094.50 |
| 163. හිඟහිටි වෙනත් ආදායම් | 59,874,113.01 | 73,273,493.97 | 113,122,984.29 | 20,024,622.69 | 59,874,113.01 |
| 172. පෙර ගෙවුම් (අත්තිකාරම්) | 3,225,127.10 | 1,522,647.79 | 1,453,137.01 | 3,294,637.88 | 3,225,127.10 |
| අගරු අත්තිකාරම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **එකතුව** | **185,310,005.40** | **86,106,823.74** | **133,143,715.33** | **138,273,113.81** | **185,310,005.40** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැලියගොඩ

සටහන 10

ආයෝජන

| | | | | | |
|---|---|---|---|---|---|
| **181. ස්ථාවර තැන්පත්** | | | | | |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | | | | | |
| **ගි.අ.318031100275** | 7,500,000.00 | | 7,500,000.00 | 0.00 | 7,500,000.00 |
| **ගි.අ.318031100243** | 2,500,000.00 | | 2,500,000.00 | 0.00 | 2,500,000.00 |
| **ගි.අ.318031300002** | 500,000.00 | | | 500,000.00 | 500,000.00 |
| ජාතික ඉ.කි.බැංකුව-රත්නපුර | | | | | |
| **2-0010-01-8442-0** | 1,000,000.00 | | | 1,000,000.00 | 1,000,000.00 |
| ජාතික ඉ.කි.බැංකුව-ඇහැළියගොඩ | | | | | |
| **2/0917/01/89341** | | 10,000,000.00 | | 10,000,000.00 | |
| මහජන බැංකුව-ඇහැළියගොඩ | | | | | |
| **085600100013303-1** | | 10,000,000.00 | | 10,000,000.00 | |
| **085-600100077770** | 5,000,000.00 | | | 5,000,000.00 | 5,000,000.00 |
| **ආපසු ගෙවියයුතු තැන්පත් (සේවක ඇප)** | 403,606.68 | 65,308.18 | 42,548.04 | 426,366.82 | 403,606.68 |
| එකතුව | **16,903,606.68** | **20,065,308.18** | **10,042,548.04** | **26,926,366.82** | **16,903,606.68** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

| විස්තරය | 2022.01.01 දිනට පිරිවැය | 2022 එකතු කිරීම | 2022 ඉවත් කිරීම | 2022.12.31.දිනට ශේෂය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| සටහන 11 | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | | | | |
| 191 .මහජන බැංකුව ජංගම ගිණුම-085-1001-7-0000674 | 14,332,375.65 | 138,123,059.74 | 133,115,718.33 | 19,339,717.06 | 14,332,375.65 |
| 193. මහජන බැංකුව ඉතිරි කිරීමේ ගිණුම 085-2-001-1-0071102 | 803,883.78 | 447,235.88 | | 1,251,119.66 | 803,883.78 |
| **එකතුව** | **15,136,259.43** | **138,570,295.62** | **133,115,718.33** | **20,590,836.72** | **15,136,259.43** |
| | | | | | |
| සටහන 12 | | | | | |
| ජංගම නොවන වගකීම් | | | | | |
| 221. දේශිය ණය සංවර්ධන අරමුදල (වාරික) | 9,033,033.54 | 54,881.91 | 675,328.71 | 8,412,586.74 | 9,033,033.54 |
| **එකතුව** | **9,033,033.54** | **54,881.91** | **675,328.71** | **8,412,586.74** | **9,033,033.54** |
| | | | | | |
| සටහන 13 | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| ආපසු ගෙවියයුතු සේවක ඇප තැන්පත් | 403,606.68 | | | 426,366.82 | 403,606.68 |
| 231. වියදම් ණය හිමියෝ | 36,432,679.70 | | | 18,077,727.67 | 36,432,679.70 |
| 222. දේශිය ණය සංවර්ධන අරමුදල(පොළී) | 0.00 | | | 0.00 | 0.00 |
| 232. කර්මාන්ත ණය හිමියෝ | 0.00 | | | 0.00 | 0.00 |
| 241. කලින් ලද ආදායම | 400,742.15 | | | 607,173.10 | 400,742.15 |
| 252. ආදායම් වෙනුවෙන් තැන්පත් | | | | 0.00 | |
| 253. පුස්තකාල තැන්පත් | 51,425.00 | | | 57,425.00 | 51,425.00 |
| 257. විවිධ තැන්පත් | 4,377,547.55 | | | 4,368,956.84 | 4,377,547.55 |
| **එකතුව** | **41,666,001.08** | | | **23,537,649.43** | **41,666,001.08** |
| | | | | | |
| සටහන 14 | | | | | |
| හිමිකම් | | | | | |
| 211. සමුච්චිත අරමුදල හා ඌණතා ගිණුම | 177,630,783.05 | | | 165,823,624.94 | 177,630,783.05 |
| 212. ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම | 162,757,107.25 | | | 163,843,403.50 | 162,757,107.25 |
| **එකතුව** | **340,387,890.30** | | | **329,667,028.44** | **340,387,890.30** |

ලේකම්

ලේකම්
ප්‍රාදේශිය සභාව
ඇහැළියගොඩ

සභාපති

සභාපති
ප්‍රාදේශීය සභාව
ඇහැළියගොඩ

எ.பி.ச. - E.P.S. -

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව